**<u>කොළඹ මහාධිකරණය අංක - 01</u>**

**<u>මහාධිකරණ විනිසුරු ඒ.කේ.එම්.පටබැඳිගේ මැතිතුමා ඉදිරිපිටදීය.</u>**

**<u>නඩු අංකය : HC/7767/2015</u>**

**<u>දිනය : 2025.03.27</u>**

සටහන් ගැනීම : ල/ලේ. මධුෂානි කරුණාරත්න මිය විසිනි.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**- පැමිණිලිකරු -**

**01. කුලසිරි උඩුගම්පල.**

**-විත්තිකරු-**

# <u>තී න් දු ව.</u>

මෙම නඩුවේ චූදිතට විරුද්ධව ශ්‍රී ලංකා ජනරජයේ නීතිපතිවරයා විසින් පහත සඳහන් චෝදනා 22 මත අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇත.

01. වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 02 වන දින සහ වර්ෂ 2002 ක් වූ සැප්තැම්බර් මස 03 වන දින අතර කාලසීමාව තුළ මෙම අධිකරණ බලසීමාව තුළ පිහිටි මහනුවරදී, කටුගස්තොටදී සහ අවිස්සාවේල්ල අධිකරණ බලප්‍රදේශයට අයත් අතුරුගිරියේදී හා කොළඹදී යුෂ්මතා ශ්‍රී

ලංකා රාජ්‍යයේ ආරක්ෂාවට හෝ යහපතට අගතිදායක විය හැකි ක්‍රියාවක් හෝ ශ්‍රී ලංකා රාජ්‍යයට එරෙහිව කටයුතු කරන සතුරෙකුට සෘජුව හෝ වක්‍රව ප්‍රයෝජනයක් ලබා ගත හැකි ආකාරයේ ක්‍රියාවක් සිදු කිරීමෙන් එනම්, ශ්‍රී ලංකා ජනරජයේ ස්වෛරීයභාවය සහ භෞමික අඛණ්ඩතාවය රැක ගැනීමේ කාර්යයේ යෙදී සිටි යුධ හමුදා බුද්ධි ඒකකය යටතේ ක්‍රියාත්මකව තිබූ දුරස්ථ විහිදුම් බලකායේ නිලධාරීන් ලැගුම් ගෙන සිටි අතුරුගිරිය මිලේනියම් නිවාස සංකීර්ණයේ පිහිටි ශ්‍රී ලංකා යුධ හමුදාවට අයත් ආරක්ෂක නිවසද, එහි සිටි හමුදා නිලධාරීන් හා බුද්ධි අංශයේ සේවකයින්ද, ඔවුන්ගේ මෙහෙයුම් සහ එම මෙහෙයුම් සඳහා භාවිතා කරන යුධ භාණ්ඩද, පිළිබඳව නිල රහස් එකතු කිරීමෙන්, එනම් එම නිලධාරීන්ගේ ක්‍රියාවන් සහ කටයුතු, නීති විරෝධී නොවන බවට සාධාරණ හේතු තිබියදී හෝ ඒ බවට තොරතුරු ලැබී තිබියදී එකී රහස් එකතු කිරීමෙන්, එනම්,

(i) ඉහත සඳහන් නිලධාරීන් රැඳී සිටි ආරක්ෂක නිවස වැටලීමෙන්, හෝ

(ii) එම ආරක්ෂක නිවස පරීක්ෂා කිරීමෙන්, හෝ

(iii) එම ආරක්ෂක නිවසේ යුධ භාණ්ඩ ගබඩා කර තිබූ අවි ආයුධවල තොරතුරු වාර්තා කිරීමෙන් හෝ කරවීමෙන්, හෝ

(iv) එම ආරක්ෂක නිවසේ තිබූ යුධ භාණ්ඩ හා රාජකාරීමය කටයුතු පිළිබඳ තොරතුරු අඩංගු ලිපි ගොනු තම භාරයට ගැනීමෙන්, හෝ

(v) එම ආරක්ෂක නිවසේ එම අවස්ථාවේ සිටි යුධ හමුදා නිලධාරීන් ප්‍රශ්න කර තම අත්අඩංගුවට ගැනීමෙන්, හෝ

(vi) එම ආරක්ෂක නිවසේ තිබූ යුධ භාණ්ඩ තම භාරයට ගැනීමෙන්;

හෝ ඉහත සඳහන් i-vi දක්වා ක්‍රියාවන් හෝ එයින් එකක් හෝ කිහිපයක් හෝ සිදු කිරීමෙන් යුෂ්මතා 1955 අංක 32 දරණ නිල රහස් පනතේ 6(1) (ඉ) වගන්තිය උල්ලංඝණය කළ බැවින්, එකී පනතේ 26(1) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කරන ලද බවය.

02. ඉහත සඳහන් වේලාවේදී, ස්ථානවලදී හා ක්‍රියාකලාපයේදීම යුෂ්මතා ශ්‍රී ලංකා රාජ්‍යයේ ආරක්ෂාවට හෝ යහපතට අගතිදායක විය හැකි ක්‍රියාවක් හෝ ශ්‍රී ලංකා රාජ්‍යයට එරෙහිව කටයුතු කරන සතුරෙකුට ඍජුව හෝ වක්‍රව ප්‍රයෝජනයක් ලබාගත හැකි ආකාරයේ ක්‍රියාවක් සිදු කිරීමෙන් එනම්, ශ්‍රී ලංකා ජනරජයේ ස්වෛරීයභාවය සහ භෞමික අඛණ්ඩතාවය රැක ගැනීමේ කාර්යයේ යෙදී සිටි යුධ හමුදා බුද්ධි ඒකකය යටතේ ක්‍රියාත්මකව තිබූ දුරස්ථ විහිදුම් බලකායේ නිලධාරීන් ලැගුම්ගෙන සිටි අතුරුගිරිය මිලේනියම් නිවාස සංකීර්ණයේ පිහිටි ශ්‍රී ලංකා යුධ හමුදාවට අයත් ආරක්ෂක නිවසද, එහි සිටි හමුදා නිලධාරීන් හා බුද්ධි අංශයේ සේවකයින්ද, ඔවුන්ගේ මෙහෙයුම් සහ එම මෙහෙයුම් සඳහා භාවිතා

කරන යුධ භාණ්ඩද පිළිබඳව නිල නිල රහස් ප්‍රසිද්ධ කිරීමෙන්, එනම් එම නිලධාරීන්ගේ ක්‍රියාවන් සහ කටයුතු, නීති විරෝධී නොවන බවට සාධාරණ හේතු තිබියදී හෝ ඒ බවට තොරතුරු ලැබී තිබියදී එකී රහස් ප්‍රසිද්ධ කිරීමෙන්, එනම්,

(i) ඉහත කී ආරක්ෂක නිවසේ ගබඩා කර තිබූ යුධ භාණ්ඩ එකී නිවසේ සාලයට ගෙනවිත් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීමෙන්, එකී භාණ්ඩ පිළිබඳව ලේඛනයක් සකස් කරන ලෙසට තමා යටතේ සිටින නිලධාරියෙකුට හෝ නිලධාරීන්ට උපදෙස් දීමෙන්, හෝ

(ii) තම භාරයට ගත් හමුදා නිලධාරීන්, බුද්ධි අංශයේ සේවකයින් හා යුධ භාණ්ඩ, නාරාහේන්පිට යුධ හමුදා පොලිස් සේවා බලකා මූලස්ථානයට ගෙන යාමෙන්, හෝ

(iii) තම භාරයට ගත් එකී හමුදා නිලධාරීන්, බුද්ධි අංශයේ සේවකයින් හා යුධ භාණ්ඩ කුරුඳුවත්ත පොලිස් ස්ථානයට ගෙන ගොස් පොදු ස්ථානවල තැබීමෙන්, හෝ

(iv) තම භාරයට ගත් එකී යුධ භාණ්ඩ කුරුඳුවත්ත පොලිස් ස්ථාන භූමියේදී ප්‍රදර්ශනය කිරීමෙන්, හෝ

(iv) එකී භාරයට ගත් යුධ භාණ්ඩ කුරුඳුවත්ත පොලිස් ස්ථානයේදී ඡායාරූප ගත කරවීමෙන් සහ වීඩියෝ පටිගත කිරීමට ඉඩ සැලැස්වීමෙන්, හෝ

(vi) අත්අඩංගුවට ගන්නා ලද යුධ හමුදා භාණ්ඩ සම්බන්ධයෙන් එකී භාණ්ඩ හඳුනාගෙන ලැයිස්තුගත කිරීම සඳහා විශේෂ පොලිස් කාර්ය බලකායේ සහකාර පොලිස් අධිකාරී පී.එඩාමා වෙත උපදෙස් දීමෙන්, හෝ

(vii) තම භාරයට ගත් යුධ හමුදා නිලධාරීන් හා යුධ භාණ්ඩ මහනුවර පිහිටි පොලිස් නිල සුනඛ අංශයේ පොදු ස්ථානවල තැබීමෙන්, හෝ

(viii) තම භාරයට ගත් එකී යුධ භාණ්ඩ මහනුවර පිහිටි පොලිස් නිල සුනඛ අංශයේ තැන්පත් කිරීමෙන් සහ එහිදී එම භාණ්ඩ ප්‍රදර්ශනය කිරීමෙන්, හෝ

(ix) මහනුවර පිහිටි පොලිස් නිල සුනඛ අංශයේදී එකී යුධ භාණ්ඩ ඡායාරූප ගත කිරීමට සහ වීඩියෝ පටිගත කිරීමට ඉඩ සැලැස්වීමෙන්, හෝ

(x) තම භාරයට ගත් එකී යුධ හමුදා නිලධාරීන්ව මහනුවර හා කටුතස්තොට පොලිස් ස්ථානවලට රැගෙන යාමෙන්, හෝ

(xi) තම භාරයට ගත් එකී යුධ හමුදා නිලධාරීන්ව 2002 ජනවාරි 03 වන දින සිට 2002 ජනවාරි 13 වන දින දක්වා මහනුවර හා කටුගස්තොට පොලිස් ස්ථානවල අයුතු ලෙස සිරකර තැබීමෙන්, හෝ

(xii) තම අත්අඩංගුවට ගත් යුධ හමුදා නිලධාරීන් හා බුද්ධි අංශ සේවකයින්, නීත්‍යානුකූල ක්‍රියාවන්හි යෙදී තිබූ බව දැන දැනම හෝ ඒ බව දැන ගැනීමට සාධාරණ හේතු තිබියදී කිසිදු සාධාරණ පදනමක් නොමැතිව හෝ යුක්ති සහගත නොවන බව දනිමින්ම හෝ මහනුවර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන්, හෝ

(xiii) තම භාරයට ගත් එකී යුධ හමුදා නිලධාරීන්ට හා බුද්ධි අංශ සේවකයින්ට විරුද්ධව නෛතික පදනමකින් තොර වූ චෝදනා එකී අධිකරණයේ ගොනු කිරීමෙන් හෝ ගොනු කිරීමට කටයුතු කිරීමෙන්, හෝ;

ඉහත සඳහන් i-xiii දක්වා ක්‍රියාවන් හෝ එයින් එකක් හෝ කිහිපයක් සිදු කිරීමෙන් යුෂ්මතා 1955 අංක 32 දරණ නිල රහස් පනතේ 6(1) (ඉ) වගන්තිය උල්ලංඝණය කළ බැවින්, එකී පනතේ 26(1) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කරන ලද බවය.

03. ඉහත පළවන චෝදනාවේ සඳහන් වේලාවේදී, ස්ථානවලදී හා ක්‍රියාකලාපයේදීම යුෂ්මතා ශ්‍රී ලංකා රාජ්‍යයේ ආරක්ෂාවට හෝ යහපතට අගතිදායක විය හැකි ක්‍රියාවක් හෝ ශ්‍රී ලංකා රාජ්‍යයට එරෙහිව කටයුතු කරන සතුරෙකුට සෘජුව හෝ වක්‍රව ප්‍රයෝජනයක් ලබා ගත හැකි ආකාරයේ ක්‍රියාවක් සිදු කිරීමෙන් එනම්, ශ්‍රී ලංකා ජනරජයේ ස්වෛරීයභාවය සහ භෞමික අඛණ්ඩතාවය රැක ගැනීමේ කාර්යයේ යෙදී

සිටි යුධ හමුදා බුද්ධි ඒකකය යටතේ ක්‍රියාත්මකව තිබූ දුරස්ථ විහිදුම් බලකායේ නිලධාරීන් ලැගුම් ගෙන සිටි අතුරුගිරිය මිලේනියම් නිවාස සංකීර්ණයේ පිහිටි ශ්‍රී ලංකා යුධ හමුදාවට අයත් ආරක්ෂක නිවසද, එහි සිටි හමුදා නිලධාරීන් හා බුද්ධි අංශයේ සේවකයින්ද, ඔවුන්ගේ මෙහෙයුම් සහ එම මෙහෙයුම් සඳහා භාවිතා කරන යුධ භාණ්ඩද, පිළිබඳව නිල රහස් භාවිතා කිරීමෙන් එනම්, එම නිලධාරීන්ගේ හා සේවකයින්ගේ ක්‍රියාවන් සහ කටයුතු, නීති විරෝධී නොවන බවට සාධාරණ හේතු තිබියදී හෝ ඒ බවට තොරතුරු ලැබී තිබියදී භාවිතා කිරීමෙන් එනම්,

(i) එම ආරක්ෂක නිවසේ ගබඩා කර තිබූ යුධ භාණ්ඩ එකී නිවසේ ආරක්ෂක ස්ථානයෙන් පිටතට ගෙන ඒමට කටයුතු කිරීමෙන්, හෝ

(ii) එකී භාණ්ඩ පිළිබඳව ලේඛනගත කරන ලෙසට තමා යටතේ සිටින නිලධාරියෙකුට හෝ නිලධාරීන්ට උපදෙස් දීමෙන්, හෝ

(iii) තම භාරයට ගත් එකී හමුදා නිලධාරීන්, බුද්ධි අංශයේ සේවකයින් හා යුධ භාණ්ඩ කුරුඳුවත්ත පොලිස් ස්ථානයට ගෙන ගොස් පොදු ස්ථානවල තැබීමෙන් හෝ

(iv) කුරුඳුවත්ත පොලිස් ස්ථානයේ දී තම සන්තකයේ තිබූ යුධ භාණ්ඩ ඡායාරූප ගත කිරීමට සහ වීඩියෝ පටිගත කිරීමට අවකාශය ලබාදී යුධ හමුදාවට අයත් නීති විරෝධී ඒකකයක්

සම්බන්ධයෙන් වැටලීමක් කළ බවට වැරදි වැටහීමක් ඇති කිරීමට කටයුතු කිරීමෙන්, හෝ

(v) තමා රැස් කර ගත් තොරතුරු, තම භාරයට ගත් භාණ්ඩ මහනුවර පිහිටි පොලිස් නිල සුනඛ අංශය වෙත රැගෙන යැමට හේතුවක් ලෙස යොදා ගැනීමෙන්, හෝ

(vi) මහනුවර පිහිටි පොලිස් නිල සුනඛ අංශයේ දී එකී යුධ භාණ්ඩ ඡායාරූප ගත කිරීමට සහ වීඩියෝ පටිගත කිරීමට ඉඩ සලස්වා දීමෙන්, වැටලීමක් කළ බව ඇඟවීමට කටයුතු කිරීමෙන්, හෝ

(vi) මහනුවර පිහිටි පොලිස් නිල සුනඛ අංශයේදී එකී යුධ භාණ්ඩ ඡායාරූප ගත කිරීමට සහ වීඩියෝ පටිගත කිරීමට ඉඩ සලස්වා දීමෙන්, වැටලීමක් කල බව ඇඟවීමට කටයුතු කිරීමෙන්, හෝ

(vii) තම භාරයට ගත් එකී යුධ හමුදා නිලධාරීන්ව 2002 ජනවාරි 03 වන දින සිට 2002 ජනවාරි 13 වන දින දක්වා මහනුවර හා කටුගස්තොට පොලිස් ස්ථානයන්හි අයුතු ලෙස සිරකර තැබීමෙන්, හෝ

(viii) එකී තොරතුරු තම භාරයට ගත් එකී යුධ හමුදා නිලධාරීන්ව පදනමක් නොමැතිව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට යොදා ගැනීමෙන්, හෝ

(ix) එකී තොරතුරු තම භාරයට ගත් යුධ හමුදා නිලධාරීන්ට විරුද්ධව නෛතික පදනමක් නොමැතිව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ චෝදනා ගොනු කිරීමට යොදා ගැනීමෙන්, හෝ

ඉහත සඳහන් i-ix දක්වා ක්‍රියාවන් හෝ එයින් එකක් හෝ කිහිපයක් හෝ සිදු කිරීමෙන් යුෂ්මතා 1955 අංක 32 දරණ නිල රහස් පනතේ 6(1) (ඉ) වගන්තිය උල්ලංඝණය කළ බැවින්, එකී පනතේ 26(1) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කරන ලද බවය.

04. ඉහත සඳහන් වේලාවේදී, ස්ථානවලදී හා ක්‍රියාකලාපයන් තුළදීම යුෂ්මතා ශ්‍රී ලංකා රාජ්‍යයේ ආරක්ෂාවට හෝ යහපතට අගතිදායක විය හැකි ක්‍රියාවක් හෝ ශ්‍රී ලංකා රාජ්‍යයට එරෙහිව කටයුතු කරන සතුරෙකුට ඍජුව හෝ වක්‍රව ප්‍රයෝජනයක් ලබාගත හැකි ආකාරයේ ක්‍රියාවක් සිදු කිරීමෙන් එනම්, ශ්‍රී ලංකා ජනරජයේ ස්වෛරීයභාවය සහ භෞමික අඛණ්ඩතාවය රැක ගැනීමේ කාර්යයේ යෙදී සිටි යුධ හමුදා බුද්ධි ඒකකය යටතේ තිබූ දුරස්ථ විහිදුම් බලකායේ නිලධාරීන් ලැගුම්ගෙන සිටි අතුරුගිරිය මිලේනියම් නිවාස සංකීර්ණයේ පිහිටි ශ්‍රී ලංකා යුධ හමුදාවට අයත් නිවස, එහි සිටි හමුදා නිලධාරීන් හා බුද්ධි අංශයේ සේවකයින්, ඔවුන්ගේ මෙහෙයුම් සහ එම මෙහෙයුම් සඳහා භාවිතා කරන යුධ භාණ්ඩ පිළිබඳ නිල රහස් සන්නිවේදනය කිරීමෙන් එනම්, එම නිලධාරීන්ගේ

ක්‍රියාවන් සහ කටයුතු නීති විරෝධී නොවන බවට සාධාරණ හේතු තිබියදී හෝ ඒ බවට තොරතුරතු ලැබී තිබියදී සන්නිවේදනය කිරීමෙන් එනම්,

(i) එකී ආරක්ෂක නිවසේ සිට යුෂ්මතා ජංගම දුරකථනයක් මගින් ඉහත ආරක්ෂක නිවස, යුධ භාණ්ඩ හා හමුදා නිලධාරීන් සම්බන්ධ තොරතුරු පැමිණිල්ල නොදත් පුද්ගලයෙකුට හෝ පුද්ගලයින්ට සන්නිවේදනය කිරීමෙන් හෝ

(ii) අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන්, වැටලීමට අදාල නිවසට කැඳවා කරුණු අනාවරණය කිරීමෙන්, ස්ථානාධිපතිවරයා සහ එම පොලීසියේ තවත් නිලධාරීන් එකී ආරක්ෂක නිවසට කැඳවීමෙන්, හෝ

(iii) තම සන්තකයේ තිබෙන යුධ භාණ්ඩ හඳුනා ගැනීම පිණිස ලැයිස්තු ගත කිරීමට විශේෂ පොලිස් කාර්ය බලකායේ සහකාර පොලිස් අධිකාරී පී. එඩාමෝ යන අය කැඳවා උපදෙස් දීමෙන්,

(iv) තම භාරයට ගත් එකී යුධ හමුදා නිලධාරීන් සහ යුධ භාණ්ඩ කුරුඳුවත්ත පොලිස් ස්ථානයට රැගෙන යන බවට පැමිණිල්ල නොදත් තවත් අයෙකුට හෝ අයවලුන්ට දැනුම් දීමෙන් සහ එම දැනුම් දීම හේතුවෙන් එකී යුධ භාණ්ඩ යම් අයවලුන්ට

ඡායාරූප ගත කිරීමට සහ වීඩියෝ පටිගත කිරීමට ඉඩ සැලැස්වීමෙන්, හෝ

(v) තම භාරයට ගත් යුධ හමුදා නිලධාරීන් සහ යුධ භාණ්ඩ පිළිබඳව අධිකරණයට පදනමක් නොමැතිව කරුණු සන්නිවේදනය කිරීමෙන්,

(vi) තම භාරයට ගත් යුධ හමුදා නිලධාරීන්/බුද්ධි අංශ සාමාජිකයින් මහනුවර සහ කටුගස්තොට පොලිස් ස්ථානවලට පදනමක් නොමැතිව ඉදිරිපත් කර එකී නිලධාරීන්ගේ අනන්‍යතාවය සන්නිවේදනය කිරීම

ඉහත සදහන් i-vi දක්වා ක්‍රියාවන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම සිදු කිරීමෙන් යුෂ්මතා 1955 අංක 32 දරණ නිල රහස් පනතේ 6(1) (ඉ) වගන්තිය උල්ලංඝණය කළ බැවින්, එකී පනතේ 26(1) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කරන ලද බවය.

05. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 03 වන දින සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 05 වන දින අතර කාලසීමාව තුළදී, මහනුවර හිදී යුෂ්මතා ෂාවුල් හමීඩ් මොහොමඩ් නිලාම් නැමැත්තා මායිම් කරනු ලැබූ සීමා වලින් පිටත යෑම වැලැක්වෙන ආකාරයට අයුතු ලෙස අවහිර කිරීමේ ක්‍රියාව කිරීමට මහනුවර පොලීසියේ මූලස්ථාන පොලිස් පරීක්ෂක, ප්‍රධාන පොලිස් පරීක්ෂක එඩ්මන්

මහේන්ද්‍රට ඕනෑකමින් අනුබල දුන් බවද, එකී අනුබල දීමේ හේතුවෙන් එකී එඩ්මන් මහේන්ද්‍ර විසින් එම ක්‍රියාව කරන ලද බවද, එකී අවස්ථාවේදී යුෂ්මතා තුළ පැවැති අදහස සහ දැනුම ඇතිව එකී එඩ්මන් මහේන්ද්‍ර නමැති අය එම ක්‍රියාව කලා නම් ඔහු දණ්ඩ නීති සංග්‍රහයේ 333 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු ෂාවුල් හමීඩ් මොහොමඩ් නිලාම් නමැත්තා අයුතු ලෙස සිරකර තැබීමේ වරදට වරදකරු වන බවද, එබැවින් යුෂ්මතා දණ්ඩ නීති සංග්‍රහයේ 103 වගන්ති සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 333 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කල බවය.

06. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 03 වන දින සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 05 වන දින අතර කාලසීමාව තුළදී, මහනුවර හිදී යුෂ්මතා ප්‍රේම ආනන්ද උදලාගම නැමැත්තා මායිම් කරනු ලැබූ සීමා වලින් පිටත යෑම වැලැක්වෙන ආකාරයට අයුතු ලෙස අවහිර කිරීමේ ක්‍රියාව කිරීමට මහනුවර පොලීසියේ මූලස්ථාන පොලිස් පරීක්ෂක, ප්‍රධාන පොලිස් පරීක්ෂක එඩ්මන් මහේන්ද්‍රට ඕනෑකමින් අනුබල දුන් බවද, එකී අනුබල දීමේ හේතුවෙන් එකී එඩ්මන් මහේන්ද්‍ර විසින් එම ක්‍රියාව කරන ලද බවද, එකී අවස්ථාවේදී යුෂ්මතා තුළ පැවති අදහස සහ දැනුම ඇතිව එකී එඩ්මන් මහේන්ද්‍ර නමැති අය එම ක්‍රියාව කලා නම් ඔහු දණ්ඩ නීති සංග්‍රහයේ 333 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු ප්‍රේම ආනන්ද උදලාගම නමැත්තා අයුතු ලෙස

සිරකර තැබීමේ වරදට වරදකරු වන බවද, එබැවින් යුෂ්මතා දණ්ඩ නීති සංග්‍රහයේ 103 වගන්ති සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 333 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කල බවය.

07. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 03 වන දින සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 05 වන දින අතර කාලසීමාව තුළදී, මහනුවර හිදී යුෂ්මතා ඉලන්දරගේ එදිරිසිංහ ජයමාන්න නැමැත්තා මායිම් කරනු ලැබූ සීමා වලින් පිටත යෑම වැළැක්වෙන ආකාරයට අයුතු ලෙස අවහිර කිරීමේ ක්‍රියාව කිරීමට මහනුවර පොලිසියේ මූලස්ථාන පොලිස් පරීක්ෂක, ප්‍රධාන පොලිස් පරීක්ෂක එඩ්මන් මහේන්ද්‍රට ඕනෑකමින් අනුබල දුන් බවද, එකී අනුබල දීමේ හේතුවෙන් එකී එඩ්මන් මහේන්ද්‍ර විසින් එම ක්‍රියාව කරන ලද බවද, එකී අවස්ථාවේදී යුෂ්මතා තුළ පැවැති අදහස සහ දැනුම ඇතිව එකී එඩ්මන් මහේන්ද්‍ර නමැති අය එම ක්‍රියාව කලා නම් ඔහු දණ්ඩ නීති සංග්‍රහයේ 333 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු ඉලන්දරගේ එදිරිසිංහ ජයමාන්න නමැත්තා අයුතු ලෙස සිරකර තැබීමේ වරදට වරදකරු වන බවද, එබැවින් යුෂ්මතා දණ්ඩ නීති සංග්‍රහයේ 103 වගන්ති සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 333 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කල බවය.

08. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 03 වන දින සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 05 වන දින අතර කාලසීමාව තුළදී, මහනුවර හිදී යුෂ්මතා හබීබ් මොහොමඩ් හිල්මි නැමැත්තා මායිම් කරනු ලැබූ සීමා වලින් පිටත යෑම වැලැක්වෙන ආකාරයට අයුතු ලෙස අවහිර කිරීමේ ක්‍රියාව කිරීමට මහනුවර පොලීසියේ මූලස්ථාන පොලිස් පරීක්ෂක, ප්‍රධාන පොලිස් පරීක්ෂක එඩ්මන් මහේන්ද්‍රට ඕනෑකමින් අනුබල දුන් බවද, එකී අනුබල දීමේ හේතුවෙන් එකී එඩ්මන් මහේන්ද්‍ර විසින් එම ක්‍රියාව කරන ලද බවද, එකී අවස්ථාවේදී යුෂ්මතා තුළ පැවැති අදහස සහ දැනුම ඇතිව එකී එඩ්මන් මහේන්ද්‍ර නමැති අය එම ක්‍රියාව කලා නම් ඔහු දණ්ඩ නීති සංග්‍රහයේ 333 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු හබීබ් මොහොමඩ් හිල්මි නමැත්තා අයුතු ලෙස සිරකර තැබීමේ වරදට වරදකරු වන බවද, එබැවින් යුෂ්මතා දණ්ඩ නීති සංග්‍රහයේ 103 වගන්ති සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 333 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කල බවය.

09. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 03 වන දින සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 05 වන දින අතර කාලසීමාව තුළදී, මහනුවර හිදී යුෂ්මතා හේරත් මුදියන්සේලාගේ නිශ්ශංක හේරත් නැමැත්තා මායිම් කරනු ලැබූ සීමා වලින් පිටත යෑම වැලැක්වෙන ආකාරයට අයුතු ලෙස අවහිර කිරීමේ ක්‍රියාව කිරීමට

මහනුවර පොලිසියේ මූලස්ථාන පොලිස් පරීක්ෂක, ප්‍රධාන පොලිස් පරීක්ෂක එඩ්මන් මහේන්ද්‍රට ඕනෑකමින් අනුබල දුන් බවද, එකී අනුබල දීමේ හේතුවෙන් එකී එඩ්මන් මහේන්ද්‍ර විසින් එම ක්‍රියාව කරන ලද බවද, එකී අවස්ථාවේදී යුෂ්මතා තුළ පැවති අදහස සහ දැනුම ඇතිව එකී එඩ්මන් මහේන්ද්‍ර නමැති අය එම ක්‍රියාව කලා නම් ඔහු දණ්ඩ නීති සංග්‍රහයේ 333 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු හේරත් මුදියන්සේලාගේ නිශ්ශංක හේරත් නමැත්තා අයුතු ලෙස සිරකර තැබීමේ වරදට වරදකරු වන බවද, එබැවින් යුෂ්මතා දණ්ඩ නීති සංග්‍රහයේ 103 වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 333 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කල බවය.

10. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 05 වන දින සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 13 වන දින අතර කාලසීමාව තුළදී, කටුගස්තොට හිදී යුෂ්මතා ෂාවුල් හමීඩ් මොහොමඩ් නිලාම් නැමැත්තා මායිම් කරනු ලැබූ සීමා වලින් පිටත යෑම වැලැක්වෙන ආකාරයට අයුතු ලෙස අවහිර කිරීමේ ක්‍රියාව කිරීමට කටුගස්තොට පොලීසියේ ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක මොහොට්ටි මුදියන්සේලාගේ මද්දුම බණ්ඩාර ජයම්පති මොහොට්ටිගෙදරට ඕනෑකමින් අනුබල දුන් බවද, එකී අනුබල දීමේ හේතුවෙන් එකී මොහොට්ටි මුදියන්සේලාගේ මද්දුම බණ්ඩාර ජයම්පති මොහොට්ටිගෙදර විසින් එම ක්‍රියාව කරන ලද බවද, එකී අවස්ථාවේදී

යුෂ්මතා තුළ පැවති අදහස සහ දැනුම ඇතිව එකී මොහොට්ටි මුදියන්සේලාගේ මද්දුම බණ්ඩාර ජයම්පති මොහොට්ටිගෙදර නමැති අය එම ක්‍රියාව කලා නම් ඔහු දණ්ඩ නීති සංග්‍රහයේ 333 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු ෂාවුල් හමීඩ් මොහොමඩ් නිලාම් නමැත්තා අයුතු ලෙස සිරකර තැබීමේ වරදට වරදකරු වන බවද, එබැවින් යුෂ්මතා දණ්ඩ නීති සංග්‍රහයේ 103 වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 333 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කල බවය.

11. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 05 වන දින සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 13 වන දින අතර කාලසීමාව තුළදී, කටුගස්තොට හිදී යුෂ්මතා ප්‍රේම ආනන්ද උදලාගම නැමැත්තා මායිම් කරනු ලැබූ සීමා වලින් පිටත යෑම වැලැක්වෙන ආකාරයට අයුතු ලෙස අවහිර කිරීමේ ක්‍රියාව කිරීමට කටුගස්තොට පොලීසියේ ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක මොහොට්ටි මුදියන්සේලාගේ මද්දුම බණ්ඩාර ජයම්පති මොහොට්ටිගෙදරට ඔනෑකමින් අනුබල දුන් බවද, එකී අනුබල දීමේ හේතුවෙන් මොහොට්ටි මුදියන්සේලාගේ මද්දුම බණ්ඩාර ජයම්පති මොහොට්ටිගෙදර විසින් එම ක්‍රියාව කරන ලද බවද, එකී අවස්ථාවේදී යුෂ්මතා තුළ පැවති අදහස සහ දැනුම ඇතිව එකී මොහොට්ටි මුදියන්සේලාගේ මද්දුම බණ්ඩාර ජයම්පති මොහොට්ටිගෙදර නමැති අය එම ක්‍රියාව කලා නම් ඔහු දණ්ඩ නීති සංග්‍රහයේ 334 වන වගන්තිය යටතේ

දඬුවම් ලැබිය යුතු ප්‍රේම ආනන්ද උදලාගම නමැත්තා දවස් තුනක් හෝ ඊට වැඩි ගණනක් අයුතු ලෙස සිරකර තැබීමේ වරදට වරදකරු වන බවද, එබැවින් යුෂ්මතා දණ්ඩ නීති සංග්‍රහයේ 103 වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 334 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

12. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 05 වන දින සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 13 වන දින අතර කාලසීමාව තුළදී, කටුගස්තොට හිදී යුෂ්මතා ඉලන්දරගේ එදිරිසිංහ ජයමාන්න නැමැත්තා මායිම් කරනු ලැබූ සීමා වලින් පිටත යෑම වැලැක්වෙන ආකාරයට අයුතු ලෙස අවහිර කිරීමේ ක්‍රියාව කිරීමට කටුගස්තොට පොලීසියේ ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක මොහොට්ටි මුදියන්සේලාගේ මද්දුම බණ්ඩාර ජයම්පති මොහොට්ටිගෙදරට ඕනෑකමින් අනුබල දුන් බවද, එකී අනුබල දීමේ හේතුවෙන් එකී මොහොට්ටි මුදියන්සේලාගේ මද්දුම බණ්ඩාර ජයම්පති මොහොට්ටිගෙදර විසින් එම ක්‍රියාව කරන ලද බවද, එකී අවස්ථාවේදී යුෂ්මතා තුළ පැවති අදහස සහ දැනුම ඇතිව එකී මොහොට්ටි මුදියන්සේලාගේ මද්දුම බණ්ඩාර ජයම්පති මොහොට්ටිගෙදර නමැති අය එම ක්‍රියාව කලා නම් ඔහු දණ්ඩ නීති සංග්‍රහයේ 334 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු ඉලන්දරගේ එදිරිසිංහ ජයමාන්න නමැත්තා දවස් තුනක් හෝ ඊට වැඩි ගණනක් අයුතු ලෙස සිරකර තැබීමේ වරදට වරදකරු වන

බවද, එබැවින් යුෂ්මතා දණ්ඩ නීති සංග්‍රහයේ 103 වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 334 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

13. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 05 වන දින සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 13 වන දින අතර කාලසීමාව තුළදී, කටුගස්තොටද හිදී යුෂ්මතා හබීබ් මොහොමඩ් හිල්මි නැමැත්තා මායිම් කරනු ලැබූ සීමා වලින් පිටත යෑම වැලැක්වෙන ආකාරයට අයුතු ලෙස අවහිර කිරීමේ ක්‍රියාව කිරීමට කටුගස්තොට පොලීසියේ ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක මොහොට්ටි මුදියන්සේලාගේ මද්දුම බණ්ඩාර ජයම්පති මොහොට්ටිගෙදරට ඕනෑකමින් අනුබල දුන් බවද, එකී අනුබල දීමේ හේතුවෙන් මොහොට්ටි මුදියන්සේලාගේ මද්දුම බණ්ඩාර ජයම්පති මොහොට්ටිගෙදර විසින් එම ක්‍රියාව කරන ලද බවද, එකී අවස්ථාවේදී යුෂ්මතා තුළ පැවැති අදහස සහ දැනුම ඇතිව එකී මොහොට්ටි මුදියන්සේලාගේ මද්දුම බණ්ඩාර ජයම්පති මොහොට්ටිගෙදර නමැති අය එම ක්‍රියාව කලා නම් ඔහු දණ්ඩ නීති සංග්‍රහයේ 334 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු හබීබ් මොහොමඩ් හිල්මි නමැත්තා දවස් තුනක් හෝ ඊට වැඩි ගණනක් අයුතු ලෙස සිරකර තැබීමේ වරදට වරදකරු වන බවද, එබැවින් යුෂ්මතා දණ්ඩ නීති සංග්‍රහයේ 103 වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 334 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

14. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 05 වන දින සහ වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 13 වන දින අතර කාලසීමාව තුළදී, කටුගස්තොට හිදී යුෂ්මතා හේරත් මුදියන්සේලාගේ නිශ්ශංක හේරත් නැමැත්තා මායිම් කරනු ලැබූ සීමා වලින් පිටත යෑම වැලැක්වෙන ආකාරයට අයුතු ලෙස අවහිර කිරීමේ ක්‍රියාව කිරීමට කටුගස්තොට පොලීසියේ ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක මොහොට්ටි මුදියන්සේලාගේ මද්දුම බණ්ඩාර ජයම්පති මොහොට්ටිගෙදරට ඕනෑකමින් අනුබල දුන් බවද, එකී අනුබල දීමේ හේතුවෙන් මොහොට්ටි මුදියන්සේලාගේ මද්දුම බණ්ඩාර ජයම්පති මොහොට්ටිගෙදර විසින් එම ක්‍රියාව කරන ලද බවද, එකී අවස්ථාවේදී යුෂ්මතා තුළ පැවැති අදහස සහ දැනුම ඇතිව එකී මොහොට්ටි මුදියන්සේලාගේ මද්දුම බණ්ඩාර ජයම්පති මොහොට්ටිගෙදර නමැති අය එම ක්‍රියාව කලා නම් ඔහු දණ්ඩ නීති සංග්‍රහයේ 334 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු හේරත් මුදියන්සේලාගේ නිශ්ශංක හේරත් නමැත්තා දවස් තුනක් හෝ ඊට වැඩි ගණනක් අයුතු ලෙස සිරකර තැබීමේ වරදට වරදකරු වන බවද, එබැවින් යුෂ්මතා දණ්ඩ නීති සංග්‍රහයේ 103 වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 334 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කල බවය.

15. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ සැප්තැම්බර් මස 03 වන දින හෝ ඊට ආසන්න දිනයකදී මහනුවර හිදී

යුෂ්මතා ෂාවුල් හමීඩ් මොහොමඩ් නිලාම් නමැත්තාට විරුද්ධව අපරාධ නඩුවක් පැවරීමට හෝ වරදක් සිදු කළා යැයි යන චෝදනාවක් නැගීමට සාධාරණ වූ හෝ නීත්‍යානුකූල වූ කරුණු නොමැති බව දැන දැනම, එකී ෂාවුල් හමීඩ් මෙහොමඩ් නිලාම් නමැත්තාට පාඩු කිරීමේ අදහසින් බොරු චෝදනාවක් මත ඔහුට විරුද්ධව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී. 12056 දරණ අපරාධ නඩුවක් පැවරීමෙන් හෝ පැවරීමට සැලැස්වීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 208 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

16. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ සැප්තැම්බර් මස 03 වන දින හෝ ඊට ආසන්න දිනයකදී මහනුවර හිදී යුෂ්මතා ප්‍රේම ආනන්ද උදලාගම නමැත්තාට විරුද්ධව අපරාධ නඩුවක් පැවරීමට හෝ වරදක් සිදු කළා යැයි යන චෝදනාවක් නැගීමට සාධාරණ වූ හෝ නීත්‍යානුකූල වූ කරුණු නොමැති බව දැන දැනම, එකී ප්‍රේම ආනන්ද උදලාගම නමැත්තාට පාඩු කිරීමේ අදහසින් බොරු චෝදනාවක් මත ඔහුට විරුද්ධව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී. 12056 දරණ අපරාධ නඩුවක් පැවරීමෙන් හෝ පැවරීමට සැලැස්වීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 208 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

17. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ සැප්තැම්බර් මස 03 වන දින හෝ ඊට ආසන්න දිනයක දී මහනුවර හිදී යුෂ්මතා ඉලන්දාරිගේ එදිරිසිංහ ජයමාන්න නමැත්තාට විරුද්ධව අපරාධ නඩුවක් පැවරීමට හෝ වරදක් සිදු කළා යැයි යන චෝදනාවක් නැගීමට සාධාරණ වූ හෝ නීත්‍යානුකූල වූ කරුණු නොමැති බව දැන දැනම, එකී ඉලන්දාරිගේ එදිරිසිංහ ජයමාන්න නමැත්තාට පාඩු කිරීමේ අදහසින් බොරු චෝදනාවක් මත ඔහුට විරුද්ධව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී. 12056 දරණ අපරාධ නඩුවක් පැවරීමෙන් හෝ පැවරීමට සැලැස්වීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 208 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

18. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ සැප්තැම්බර් මස 03 වන දින හෝ ඊට ආසන්න දිනයකදී මහනුවර හිදී යුෂ්මතා හබීබ් මොහොමඩ් හිල්මි නමැත්තාට විරුද්ධව අපරාධ නඩුවක් පැවරීමට හෝ වරදක් සිදු කළා යැයි යන චෝදනාවක් නැගීමට සාධාරණ වූ හෝ නීත්‍යානුකූල වූ කරුණු නොමැති බව දැන දැනම, එකී හබීබ් මොහොමඩ් හිල්මි නමැත්තාට පාඩු කිරීමේ අදහසින් බොරු චෝදනාවක් මත ඔහුට විරුද්ධව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී. 12056 දරණ අපරාධ නඩුවක් පැවරීමෙන් හෝ පැවරීමට සැලැස්වීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 208 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

19. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ සැප්තැම්බර් මස 03 වන දින හෝ ඊට ආසන්න දිනයකදී මහනුවර හිදී යුෂ්මතා හේරත් මුදියන්සේලාගේ නිශ්ශංක හේරත් නමැත්තාට විරුද්ධව අපරාධ නඩුවක් පැවරීමට හෝ වරදක් සිදු කළා යැයි යන චෝදනාවක් නැගීමට සාධාරණ වූ හෝ නීත්‍යානුකූල වූ කරුණු නොමැති බව දැන දැනම, එකී හේරත් මුදියන්සේලාගේ නිශ්ශංක හේරත් නමැත්තාට පාඩු කිරීමේ අදහසින් බොරු චෝදනාවක් මත ඔහුට විරුද්ධව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී. 12056 දරණ අපරාධ නඩුවක් පැවරීමෙන් හෝ පැවරීමට සැලැස්වීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 208 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

20. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ සැප්තැම්බර් මස 03 වන දින හෝ ඊට ආසන්න දිනයකදී මහනුවර හිදී යුෂ්මතා ඉරාසරත්නම් සුභාෂ්කරන් නමැත්තාට විරුද්ධව අපරාධ නඩුවක් පැවරීමට හෝ වරදක් සිදු කළා යැයි යන චෝදනාවක් නැගීමට සාධාරණ වූ හෝ නීත්‍යානුකූල වූ කරුණු නොමැති බව දැන දැනම, එකී ඉරාසරත්නම් සුභාෂ්කරන් නමැත්තාට පාඩු කිරීමේ අදහසින් බොරු චෝදනාවක් මත ඔහුට විරුද්ධව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී. 12056 දරණ අපරාධ නඩුවක් පැවරීමෙන් හෝ පැවරීමට සැලැස්වීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 208 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

21. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ සැප්තැම්බර් මස 03 වන දින හෝ ඊට ආසන්න දිනයකදී මහනුවර හිදී යුෂ්මතා හෙන්දාවිතාරණ කපිල ගාමිණී හෙන්දාවිතාරණ නමැත්තාට විරුද්ධව අපරාධ නඩුවක් පැවරීමට හෝ වරදක් සිදු කළා යැයි යන චෝදනාවක් නැගීමට සාධාරණ වූ හෝ නීත්‍යානුකූල වූ කරුණු නොමැති බව දැන දැනම, එකී හෙන්දාවිතාරණ කපිල ගාමිණී හෙන්දාවිතාරණ නමැත්තාට පාඩු කිරීමේ අදහසින් බොරු චෝදනාවක් මත ඔහුට විරුද්ධව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී. 12056 දරණ අපරාධ නඩුවක් පැවරීමෙන් හෝ පැවරීමට සැලැස්වීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 208 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

22. ඉහත 1 වන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදීම සහ වර්ෂ 2002 ක් වූ සැප්තැම්බර් මස 03 වන දින හෝ ඊට ආසන්න දිනයක දී මහනුවර හිදී යුෂ්මතා ලයනල් පියනන්ද බලගල්ල නමැත්තාට විරුද්ධව අපරාධ නඩුවක් පැවරීමට හෝ වරදක් සිදු කළා යැයි යන චෝදනාවක් නැගීමට සාධාරණ වූ හෝ නීත්‍යානුකූල වූ කරුණු නොමැති බව දැන දැනම, එකී ලයනල් පියනන්ද බලගල්ල නමැත්තාට පාඩු කිරීමේ අදහසින් බොරු චෝදනාවක් මත ඔහුට විරුද්ධව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී. 12056 දරණ අපරාධ නඩුවක් පැවරීමෙන් හෝ පැවරීමට සැලැස්වීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 208 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

චූදිතට විරුද්ධව මුල් අධිචෝදනා පත්‍රය 2005.02.09 දිනැතිව ඉදිරිපත් කර ඇත. ඉන් පසුව සංශෝධිත අධිචෝදනා පත්‍රයක් වර්ෂ 2007.10.31 වන දින ඉදිරිපත් කර ඇත. නැවත වතාවක් 2011.01.27 දින සංශෝධිත අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇත.

2011.01.27 දිනැති චෝදනා 22 කින් යුතු අධිචෝදනා පත්‍රයේ සඳහන් චෝදනා 2018.04.06 වන දින පූර්ව ගාමී මහාධිකරණ විනිසුරුවරයෙකු විසින් කියවා තේරුම් කර දී ඇති අතර එකී චෝදනා 22 ට චූදිත වෙන් වෙන් වශයෙන් නිවැරදිකරු බව පවසා ඇත. ඉන්පසු නඩු විභාගය ආරම්භ කර පැමිණිල්ලේ සාක්ෂි අංක 2 ගේ සාක්ෂිය කැඳවා ඇති අතර වර්ෂ 2019.08.01 දින පූර්වගාමී මහාධිකරණ විනිසුරුවරයා ඉදිරියේ මෙහෙයවූ සාක්ෂි මා ඉදිරියේ පිළිගෙන මා විසින් නඩුව විභාග කර තීන්දුව ප්‍රකාශයට පත් කිරීමට චූදිත සහ චූදිත වෙනුවෙන් පෙනී සිටින නීතිඥ මහතා එකඟ වන ලදී.

ඒ අනුව පැමිණිල්ලේ සාක්ෂි අංක 02 හැර පැමිණිල්ලේ සියළුම සාක්ෂිකරුවන් සහ චූදිත ඇතුළු විත්තියේ සාක්ෂිකරුවන් මා ඉදිරියේ සාක්ෂි දෙන ලදී.

නඩු විභාගය අවසානයේදී පැමිණිල්ල වෙනුනේ ලිඛිත සැළකිරීම් ඉදිරිපත් කල අතර චූදිත වෙනුවෙන් වාචික සැළකිරීම් හා ලිඛිත සැළකිරීම් ඉදිරිපත් කරන ලදී.

නඩු විභාගයේදී පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි අංක 02 ප්‍රේම ආනන්ද උදලාගම, සාක්ෂි අංක 06 බ්‍රිගේඩියර් කපිල හෙන්දා විතාරණ, සාක්ෂි අංක 08 මේජර් තුවාන් සුරේෂ් සලේ, සාක්ෂි අංක 09 කපිතාන් සමන් කුමාර, සාක්ෂි අංක 10 මේජර් ක්ලිෆර්ඩ් ද සොයිසා, සාක්ෂි අංක 11 බ්‍රිගේඩියර් ධර්මරත්න, සාක්ෂි අංක 12 මේජර් පොඩි රාලහාමි, සාක්ෂි අංක 38 විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කොටකදෙනිය, සාක්ෂි අංක 40 ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සමරතුංග, සාක්ෂි අංක 63 පොලිස් පරීක්ෂක කරුණාරත්න, සාක්ෂි අංක 65 උප පොලිස් පරීක්ෂක වානක ද සිල්වා සහ සාක්ෂි අංක 68 උප පොලිස් පරීක්ෂක සමරසිංහ යන සාක්ෂිකරුවන්ගේ සාක්ෂිද, පැ. 01 සිට පැ. 18 දක්වා ලේඛනද ඉදිරිපත් කරමින් පැමිණිල්ල අවසන් කරන ලදී.

පැමිණිල්ල අවසන් කිරීමෙන් පසු විත්තිය අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 200(1) උප වගන්තිය යටතේ විත්තිවාචක නොකැඳවා චූදිත නිදොස් කරන ලෙස ඉල්ලා සිටි අතර අධිකරණය එකී ඉල්ලීම ප්‍රතික්ෂේප කර විත්තිවාචක කැඳවීමට තීරණය කර චූදිතගේ අයිතිවාසිකම් පහදා දෙන ලදී. ඉන් පසු චූදිත දිවුරුම්පිට සාක්ෂි දුන් අතර චූදිත වෙනුවෙන් විශ්‍රාමික හමුදා නිලධාරී දිසානායක, යුධ හමුදා නීති නිලධාරී ගිහාන් ප්‍රදීප් සහ සහකාර පොලිස් අධිකාරී වානක ද සිල්වා යන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි කැඳවා අවසන් කරන ලදී.

2011 ජනවාරි 27 දින ඉදිරිපත් කර ඇති අධිචෝදනා පත්‍රයේ සඳහන් චෝදනා 22 න් 01 සිට 04 දක්වා චෝදනා ඉදිරිපත් කර ඇත්තේ 1955 අංක 32

දරණ නිල රහස් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරවය. 05 සිට 09 දක්වා චෝදනා ඉදිරිපත් කර ඇත්තේ එකී චෝදනාවල නම් සඳහන් පිළිවෙලින් ෂාවුල් හමීඩ් මොහොමඩ් නිලාම්, ප්‍රේම ආනන්ද උදලාගම, ඉලන්දරගේ එදිරිසිංහ ජයමාන්න, හබීබ් මොහොමඩ් හිල්මි, හේරත් මුදියන්සේලාගේ නිශ්ශංක හේරත් නමැති අයවළුන් වර්ෂ 2002 ජනවාරි මස 3 සහ 2002 ජනවාරි මස 05 දින අතර කාලසීමාව තුළ අයුතු ලෙස සිර කර තැබීමේ වරදට මහනුවර මූලස්ථාන පොලිස් පරීක්ෂක එඩ්මන් මහේන්ද්‍රට ඕනෑකමින් අනුබල දීම හේතුවෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 103 වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 333 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදවල් කරන ලද බවටය.

10 සිට 14 දක්වා චෝදනා ඉදිරිපත් කර ඇත්තේ 2002 ජනවාරි මස 05 වන දින සහ 2002 ජනවාරි 13 වන දින අතර කාලසීමාව තුළ ඉහතින් නම් සඳහන් පුද්ගලයින් කටුගස්තොට පොලීසියේ අයුතු ලෙස සිර කර තැබීමේ වරදට කටුගස්තොට පොලීසියේ ස්ථානාධිපති මොහොට්ටි මුදියන්සේලාගේ මද්දුම බණ්ඩාර ජයම්පති යන අයට ආධාර හා අනුබල දීම සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 103 වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 334 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදවල් කරන ලද බවට වේ.

15 සිට 22 දක්වා චෝදනා ඉදිරිපත් කර ඇත්තේ එකී චෝදනාවල නම් සඳහන් පිළිවෙලින් ප්‍රේම ආනන්ද උදලාගම, ෂාවුල් හමීඩ් මොහොමඩ් නිලාම්, ඉලන්දරගේ එදිරිසිංහ ජයමාන්න, හබීබ් මොහොමඩ් හිල්මි, හේරත්

මුදියන්සේලාගේ නිශ්ශංක හේරත්, ඉරාසරත්නම් සුභාෂ්කරන්, කපිල ගාමිණී හෙන්දාවිතාරණ සහ ලයනල් පියනන්ද බලගල්ල යන අයවළුන්ට මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ අංක බී. 12056 දරණ අපරාධ නඩුවක් පැවරීමට හෝ වරදක් සිදු කලා යැයි යන චෝදනාවක් නැගීමට සාධාරණ වූ හෝ නීත්‍යානුකූල වූ කරුණු නොමැති බව දැන දැනම අපරාධ නඩුවක් පැවරීමෙන් හෝ පැවරීමට සැලැස්වීමෙන් ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 208 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් කරන ලද බවට වේ.

මෙම නඩුවේ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සම්පිණ්ඩනය කිරීමට ප්‍රථමයෙන් මෙම නඩුව සම්බන්ධයෙන් විනිශ්චයකට එළැඹීමේදී අනුගමනය කළ යුතු සහ සළකා බැලිය යුතු නීතිමය සිද්ධාන්ත කිහිපයක් සැළකර සිටිමි.

නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද අධිචෝදනා පත්‍රයේ සඳහන් චෝදනා සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කිරීමේ භාරය පැමිණිල්ල සතු වේ. එහිදී විත්තියට කිසිදු ඔප්පු කිරීමේ භාරයක් නොපැවරෙන අතර පැමිණිල්ලේ සාක්ෂි සම්බන්ධයෙන් සාධාරණ සැකයක් ජනිත කිරීම පමණක් ප්‍රමාණවත් වේ. එසේම විත්තිවාචකයේ සඳහන් දූර්වලතා නොසළකා ඉදිරිපත් කර ඇති චෝදනා ඔප්පු කිරීමේ භාරය සහමුලින්ම පැමිණිල්ල මත රඳා පවතී. එසේම නඩු විභාගයේදී චූදිතට නිහඬව සිටීමේ අයිතියක්ද ඇති අතර පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොරව අදාළ චෝදනා ඔප්පු කරන තෙක් චූදිත සතුව නිර්දෝෂී භාවයේ පූර්ව නිගමනයේ රැකවරණය හිමි වේ.

පැමිණිල්ල විසින් චෝදනා සම්බන්ධයෙන් ප්‍රබල සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් විත්තිවාචකය කැඳවීමකින් තොරව වුවද විත්තිකරු නිදොස් කොට නිදහස් කළ යුතු වේ. පැමිණිල්ල ප්‍රබල නඩුවක් ගොඩනගා ඇති බවට අධිකරණයට ඒත්තු යන අවස්ථාවකදී විත්තියේ සාක්ෂි සළකා බලනු ලැබේ. මෙම නඩුවේදී චූදිත දිවුරුම් පිට සාක්ෂි දුන් අතර චූදිත වෙනුවෙන් සාක්ෂිකරුවන් තිදෙනෙකු කැඳවන ලදී. එමගින් යම් සාධාරණ සැකයක් පැමිණිල්ලේ නඩුව කෙරෙහි ඇති කරන්නේ නම් හෝ එකී සාක්ෂි ප්‍රතික්ෂේප කිරීමට අධිකරණයට නොහැකි වන අවස්ථාවකදීද, එහි වාසිය විත්තියට ලබාදිය යුතු වේ.

අපරාධ නඩුවක ඉදිරිපත් වී ඇති සාක්ෂි සළකා බැලීමේදී අධිකරණය විසින් එම සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවල පිළිගත හැකි භාවය, සාක්ෂි දීමේ විලාසය, අප්‍රමාදීත්වය, ඒකාකාරී භාවය සහ විය හැකි භාවය ඇතුළු නිර්ණායකයන් යොදා ගනු ලැබේ.

ඒ අනුව සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මත පරස්පරතාවයන් ලකුණු කර තිබීම හෝ ඌණතාවයන් පෙන්වා සිටින අවස්ථාවකදී ඒවා කෙතරම්දුරට නඩුවේ හරයට බලපාන්නේද යන්න සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරීව සළකා බැලිය යුතුය.

අනෙක්අතට සාක්ෂි විශ්ලේෂණය කිරීමේදී සෑම සාක්ෂිකරුවෙකුම සාමාන්‍ය මිනිසුන් බවද, මිනිසුන් සතු සහජ දුර්වලතාවයන්ද ඒ තුළ ගැබ්විය හැකි බවට සිත්හි තබාගත යුතුය. ඔවුන්ගේ සාක්ෂි යාන්ත්‍රිකව පටිගත කරන ලද සිද්ධියක් නැවත ප්‍රතිනිර්මාණය කරන්නාක් මෙන් ඒකාකාරී සාක්ෂියක් බලාපොරොත්තු විය නොහැකිය. එබැවින් සාමාන්‍ය මිනිසුන්ට සිදු වන අමතකවීම්, අතපසුවීම් මෙන්ම ඒවා දරාගැනීමට ඇති ශක්තිය සහ සාක්ෂිකරුවන්ගේ බුද්ධි මට්ටම, අධ්‍යාපනය, සමාජීය තරාතිරම වැනි කරුණු අනුව පුළුල්ව සළකා බැලිය යුතු වේ.

ඉහත සඳහන් මූලික සිද්ධාන්තයන් කෙරෙහි අධිකරණයෙහි සිත් යොමු කරමින් ඉදිරිපත් වී ඇති සාක්ෂිවල සම්පිණ්ඩනයක් ඉදිරිපත් කරමි.

## පැමිණිල්ලේ සාක්ෂි අංක 02

ප්‍රේම ආනන්ද උදලාගම නමැති මෙම සාක්ෂිකරු ශ්‍රී ලංකා යුධ හමුදාවට බැඳී ඇත්තේ 1987.07.08 දින දීය. 1990.06 වන මස සිට ශ්‍රී ලංකා යුධ හමුදාවේ බුද්ධි අංශයට සම්බන්ධ වී ඇත. සාක්ෂිකරුට අනුව බුද්ධි අංශ නිලධාරීන් රාජකාරී ස්වභාවය සහ පෞද්ගලික ආරක්ෂාව තකා රහසිගතව කටයුතු කරන බවද, බුද්ධි අංශයට සම්බන්ධ බවට ප්‍රසිද්ධියේ නොපවසන බවද පවසයි. 1996 පමණ සිට  සාක්ෂිකරු කපිතාන් ෂාවුල් හමීඩ් මොහොමඩ් නිලාම් යටතේ සේවය කර ඇත. වර්ෂ 2002 වන විට සාක්ෂිකරු මිලේනියම් සිටි බුද්ධි ආරක්ෂක

ඒකකයට අනුයුක්ව රාජකාරී කර ඇත. මෙම බුද්ධි ආරක්ෂක ඒකකය පිහිටා තිබී ඇත්තේ අතුරුගිරිය ප්‍රදේශයේ වන අතර එම බුද්ධි ආරක්ෂක ඒකකය කොහුවල කඳවුරේ සිට පාලනය වී ඇත. මෙම ස්ථානය පිහිටි ගොඩනැගිල්ල ඉහත කී කපිතාන් නිලාම් නමැති අයගේ බිරිඳට අයත්ව තිබූ නිවසක් බව සාක්ෂිකරු පවසයි.

වර්ෂ 2001.12.25 වන දින සිට එවකට ශ්‍රී ලංකා රජය සහ LTTE සංවිධානය අතර සටන් විරාමයක් ක්‍රියාත්මකව තිබී ඇත. සාක්ෂිකරු අනුයුක්තව සිටි බුද්ධි අංශ ඒකකය නැගෙනහිර පළාත කේන්ද්‍ර කර ගනිමින් රහස්‍ය මෙහෙයුම්වල යෙදී සිට ඇත. සාක්ෂිකරුට අනුව බොහෝවිට එකී මෙහෙයුම් LTTE පාලන ප්‍රදේශ තුළ සිදු කර ඇති අතර ඔවුන්ගේ කර්තව්‍යයන් සඳහා LTTE සංවිධානයෙන් භාරවූ පුද්ගලයින් කටයුතු කර ඇත. එවැනි ඇතැම් පුද්ගලයින් යුධ හමුදාගත කර තිබී ඇත.

2001 දෙසැම්බර් මාසයේ දිනයක මෙම මිලේනියම් සිටි නිවස්නයේ සාක්ෂිකරු සමග හේරත්, හිල්මි, ජයමාන්න සහ සුභාෂ් යන අයවළුන් සිට ඇත. ක්‍රියාන්විතයන් නොමැති අවස්ථාවලදී ඔවුන් මෙම නිවස්නයේ රැඳී සිට ඇත. රාජකාරී කටයුතු සඳහා අවශ්‍යතාවය අනුව LTTE නිල ඇඳුම්ද ඔවුන් භාවිතා කර ඇති අතර මෙම ස්ථානයේ අවි ආයුධ මෙන්ම LTTE නිල ඇඳුම් ඇතුළු යුධ හමුදා නිල ඇඳුම්ද තිබී ඇත. මෙම ස්ථානය පිළිබඳව යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක කපිල හෙන්දාවිතාරණ ඇතුළු බුද්ධි අධ්‍යක්ෂකවරුන් දැන සිටි බව සාක්ෂිකරු පවසයි.

මෙම ස්ථානයේ කාමර දෙකක් සහ මුළුතැන්ගෙයක් තිබී ඇති අතර ජනෙල්වලට පත්තර කඩදාසි අලවා තිර රෙදි දමා තිබී ඇත. එසේම නිවස වටා තාප්පයක් බැඳ, ගේට්ටුවක්ද තිබී ඇත. මෙම ස්ථානයේ තිබූ අවි ආයුධ යුධ හමුදාවෙන් නීත්‍යානුකූලව නිකුත් කර ලේඛනගත කර තිබූ බවද, එකී අවි ආයුධ සහිත කාමරයේ යතුරු සාක්ෂිකරු භාරයේ තිබූ බවද පවසයි. අවශ්‍යතාවය අනුව වැඩිපුර අවි ආයුධ බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලය හරහා ලබා ගත් බවද පවසන ලදී. නිලධාරීන්ගේ භාවිතය සඳහා ඩෝල්ෆින් වර්ගයේ වෑන් රථයක්ද, යතුරුපැදියක්ද තිබී ඇත. මේවායෙහි අංක මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර තිබූ අංක බව පැවසූ සාක්ෂිකරු මෙම ස්ථානයට බුද්ධි අංශ නිලධාරීන් හැර පිටස්තර පුද්ගලයන් නොපැමිණෙන බවද, කපිතාන් නිලාම් විටින් විට මෙම ස්ථානයට පැමිණෙන බවද පවසන ලදී.

2021 ජනවාරි 02 වන දින පස්වරු 05.00 ට පමණ තමා මෙම ස්ථානයට පැමිණෙන විට පොලිස් ජීප් රථයක් නවත්වා තිබෙනවා නිරීක්ෂණය කර ඇත. සාකෂිකරු වෑන් රථයෙන් පැමිණ ඇත්තේ නිලාම්, හිල්මි සහ හේරත් සමග වේ. එම ස්ථානයට පැමිණෙන විට පොලිස් නිලධාරීන් නිල ඇඳුමින් සිට ඇති අතර යුධ හමුදා පොලීසියේ මේජර් ක්ලිෆර්ඩ් සොයිසාද සිට ඇත. ඔහුද නිල ඇඳුමින් සිට ඇත. සාක්ෂිකරු ඇතුළු නිලධාරීන් පිරිස මෙම ස්ථානයට ගිය පසු පොලිස් කණ්ඩායම භාරව සිටි මෙම නඩුවේ චූදිත වන කුලසිරි උඩුගම්පල නමැති සහකාර පොලිස් අධිකාරීවරයා කපිතාන් නිලාම් සමග සාකච්ඡා කර ඇත. එම අවස්ථාවේදී කපිතාන් නිලාම් ඔහු සතුව තිබූ ජංගම දුරකථනයෙන් යුධ හමුදාවේ

ඉහළ නිලධාරීන් දැනුවත් කිරීමට පියවර ගෙන ඇති අතර චූදිත එයට ඉඩ ලබා නොදී කපිතාන් නිලාම්ගේ ජංගම දුරකථනය භාරයට ගත් බව පවසයි. චූදිත මෙම ස්ථානය පරීක්ෂා කිරීමට අවශ්‍ය බව පවසා ඇත. විශේෂයෙන්ම ගිනිඅවි ඇතුළු අවි ආයුධ තිබූ කාමරය පරීක්ෂා කිරීමට අවශ්‍ය බව පැවසූ විට සාක්ෂිකරු ඒ බව කපිතාන් නිලාම්ට දැනුම් දී ඇත. කපිතාන් නිලාම් ඊට අවසර දෙන ලෙස උපදෙස් දුන් පසු සාක්ෂිකරු විසින් කාමරය විවෘත කර ඇත. එම අවස්ථාවේ චූදිත **''මේ තිබෙන්නේ බඩු. මගේ වැඩේ හරි''** වශයෙන් පවසා ඇත.

එසේම මෙම ගිනිඅවි වලට අදාල ලේඛන චූදිත අතට ලබා දී ඇත. චූදිත එයට වැඩි සැළකිල්ලක් නොදක්වා එම ස්ථානයේ සිටි උප පොලිස් පරීක්ෂක ධර්මරත්න නමැති නිලධාරියාට එම ලේඛන සහිත ගොනු ලබා දුන් බව සාක්ෂිකරු පවසයි.

ඉන් පසු එම කාමරය තුළ වූ අවිආයුධ සියල්ල සාලයට ගෙනවිත් ඇත. ඉන් පසු ඒවා ලේඛනගත කර ඇත. ඒ සමගම අතුරුගිරිය පොලීසියට වාහනයක් රැගෙන එන ලෙසට චූදිත උපදෙස් දී ඇත. එසේම අතුරුගිරිය පොලීසියේ ස්ථානාධිපතිවරයාද එම ස්ථානයට කැඳවා ඇත. ඉන් පසු එම ස්ථානයට පැමිණි ලොරි රථයකට අවි ආයුධ පටවන ලෙසට උපදෙස් දී ඇත. එසේම තර්මෝබෙරික් අවි වෑන් රථයට දමා ඇත. සාක්ෂිකරුට අනුව මේ වනවිට රාත්‍රී 08.00 පසුව තිබූ බව පවසන ලදී. කෙසේවෙතත් එම ස්ථානයේ ඉදිරිපිට සාමාන්‍ය පුරවැසියන් පිරිසක් සිට ඇත.

මෙම සියළුම කර්තව්‍යන් සිදු වන අවස්ථාවේදී සාක්ෂිකරුට අනුව යුධ හමුදා පොලීසියේ නිලධාරියාද සිට ඇත. ඉන් පසු මෙම සියළුම අවි සමග සාක්ෂිකරු, කපිතාන් නිලාම්, ජයමාන්න, හේරත්, සුභාෂ්කරන් ඇතුළු පිරිසද නාරාහේන්පිට යුධ හමුදා පොලිස් මූලස්ථානයට රැගෙන ගොස් ඇත. ඒ වන විට රාත්‍රී 11.00 ට පමණ බව සාක්ෂිකරු පවසයි. එම ස්ථානයේ සිටින විට අභ්‍යන්තර කටයුතු අමාත්‍යංශයේ ලේකම් යනුවෙන් හඳුන්වන පුද්ගලයෙකු පැමිණ ඇත. එසේම බ්‍රිගේඩියර් කපිල හෙන්දාවිතාරණ ඇතුළු නිලධාරීන් පිරිසක්ද පැමිණ චූදිත සමග සාකච්ඡා කර ඇත. ඉන් පසු එම ස්ථානයෙන් කුරුඳුවත්ත පොලීසියට රැගෙන ගොස් ඇත. එම ස්ථානයට යන විට මාධ්‍යවේදීන් ඡායාරූපගත කරමින් හා වීඩියෝගත කරමින් සිට ඇති අතර සාක්ෂිකරු ඇතුළු යුධ හමුදා නිලධාරීන්ව සහ සිවිල් පුද්ගලයන් වීඩියෝ කිරීමට උත්සාහ කරන අවස්ථාවේදී ඔවුන් එයට විරෝධතාවය පල කර ඇති අතර ඒ අනුව මාධ්‍යවේදීන් ඔවුන්ව වීඩියෝ කිරීම නවතා දමා ඇත. කුරුඳුවත්ත පොලීසියේ පැයක පමණ කාලයක් සිටින අවස්ථාවේදී පොලිස් විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරී ඇතුළු නිලධාරීන් කීප දෙනෙකු පැමිණ ඇත. එසේ පැමිණි විශේෂ කාර්ය බලකා නිලධාරීන්ද කපිතාන් නිලාම් සමග සාකච්ඡා කර ඇත. ඉන් පසු ඔවුන් මහනුවර නිල සුනඛ අංශයට රැගෙන ගොස් ඇත. අනතුරුව එම ස්ථානයෙන් මහනුවර මූලස්ථාන පොලීසියට රැගෙන ගොස් ඇත. මහනුවර මූලස්ථාන පොලීසියේ සිර මැදිරියක දින දෙකක් පමණ රඳවා සිට පසුව කටුගස්තොට පොලීසියට රැගෙන ගොස් එම ස්ථානයේ දින හයක් රඳවා තබා තිබී ඇත. පසුව ඔවුන් මුදා හැර ඇත.

මිලේනියම් සිටි නිවස්නයේ ආහාර ලබා ගැනීමට අදාල ලේඛනය, ගමන් නියෝග නිකුත් කරනු ලබන ලේඛනය ඇතුලත් ලේඛනය පැ. 01 වශයෙන්ද, එහි සාක්ෂිකරුගේ නම සඳහන් ලේඛන තුනක් පැ. 01(1), පැ. 01(2), පැ. 01(3) වශයෙන්ද ලකුණු කරන ලදී. ක්ලෙමෝ බෝම්බ ලබා ගැනීමට අදාල ගොනුව පැ. 02 වශයෙන්ද, පීඩන බෝම්බ ලබා ගැනීමට අදාල ලේඛන සහිත ගොනුව පැ. 03 වශයෙන්ද ලකුණු කරන ලදී. LTTE සංවිධානයේ භාවිතා කරනු ලැබූ නිල ඇඳුම්වලට සමාන නිල ඇඳුම් ලබා ගැනීමට අදාල ලේඛනය පැ. 04 වශයෙන්ද, වාහන ලබා ගැනීමට අදාල ලේඛනය පැ. 05 වශයෙන්ද, කිලෝ 10 ට වඩා අඩු බරකින් යුත් ක්ලෙමෝ බෝම්බ නිකුත් කිරීමට අදාල ලේඛනය පැ. 06 වශයෙන්ද, පිස්තෝල, නයිට්විෂන්, දුරදක්න සහ දුරස්ථ පාලක ලබා ගැනීමට අදාල ලේකනය පැ. 07 වශයෙන්ද ලකුණු කරන ලදී.

සාක්ෂිකරු විත්තියේ හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් තමා හට ලසන්ත වික්‍රමතුංග නමැති මාධ්‍යවේදියාගේ රියදුරු පැහැර ගැනීමට අදාලවද ජන මාධ්‍යවේදියෙකු වන උපාලි තෙන්නකෝන් නමැති අයට පහර දීම සම්බන්ධයෙන් චෝදනා කර ඇති බව පිළිගන්නා ලදී.

ඊට අමතරව මෙම සාක්ෂිකරු සමග සිටි යුධ හමුදා බුද්ධි නිලධරයෙකු වන ජයමාන්න නමැති අය ඔහු විසින් ලසන්ත වික්‍රමතුංග ඝාතනය කර ඇති බවට පිළිගෙන සියදිවි නසාගෙන ඇති බව පිළිගන්නා ලදී.

එසේම සාක්ෂිකරු විසින් වර්ෂ 2001 දෙසැම්බර් මාසයේදී එවකට පැවති මහා මැතිවරණයක් ආසන්නයේ මහනුවර උඩතලවින්න ප්‍රදේශයේ මුස්ලිම් පුරවැසියන් දසදෙනෙකු වෙඩි තබා ඝාතනය කර තිබූ බවද, ඊට අදාලව එවකට ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කල අනුරුද්ධ රත්වත්තේ මහතාද, ඔහුගේ පුත්‍රයන් වන චානුක රත්වත්තේ සහ ලොහාන් රත්වත්තේ යන අයවළුන් සමග යුධ හමුදා නිලධාරීන් කීප දෙනෙකු හට චෝදනා කර තිබූ බවද පිළිගන්නා ලදී.

එසේම සාක්ෂිකරු යම්කිසි කාලසීමාවක එනම්, වර්ෂ 2008 දී කරුණා අම්මාන් සහ පිල්ලයාන් යන අයවළුන්ගේ ආරක්ෂාවට අනුයුක්ත කර තිබූ බවද පිළිගන්නා ලදී. එසේම මඩකලපුව ප්‍රදේශයට ගමන් කිරීමට අදාලව පවත්වාගෙන යන ලද යම් යම් ලේඛනවල පවත්නා වූ වෙනස්කම් කීපයක් සම්බන්ධයන් හරස් ප්‍රශ්න අසන ලදී.

## <u>පැමිණිල්ලේ සාක්ෂි අංක 06</u>

විශ්‍රාමික මේජර් ජනරාල් කපිල ගාමිණී හෙන්දාවිතාරණ වර්ෂ 2002 ජනවාරි මස වන විට බ්‍රිගේඩියර් තනතුරේ කටයුතු කර ඇති අතර යුධ හමුදාවේ බුද්ධි අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කර ඇත. යුධ හමුදාවේ බුද්ධි අංශයට අනුයුක්තව අතුරුගිරිය ප්‍රදේශයේ පිහිටි මිලේනියම් සිටි නිවාස සංකීර්ණයේ යම් නිවාසයක් භාවිතා කර ඇති අතර එම නිවාසය සොයා ගැනීමද රහසිගතව සිදු

කර ඇති බව සාක්ෂිකරු පවසයි. එකී රහසිගත භාවය ආරක්ෂා කිරීම සඳහා යුධ හමුදාපති පමණක් දැනුවත් කර ඇති අතර එය නිවසේ අයිතිකරුගෙන් හෝ රහසිගතව ආරක්ෂා කළයුතු හෙයින් කපිතාන් නිලාම් නමැති අයගේ බිරිඳට අයත් මෙම ස්ථානය තෝරා ගැනීම සඳහා අවසර ලබාදී ගිවිසුමක්ද අත්සන් කරන ලද බව සාක්ෂිකරු පවසන ලදී. ඊට අදාල ගොනුව පැ. 08 වශයෙන් ලකුණු කර ලදී. මෙම ස්ථානයේ ගිවිසුම්ගත වීමට අදාලව හුවමාරු වී ඇති ලේඛන සහ ගිවිසුම පැ. 08(1) සහ පැ. 08(2) වශයෙන් ලකුණු කරන ලදී. එසේම පැ. 01 සිට පැ. 07 දක්වා ලකුණු කරන ලද ලේඛන සාක්ෂිකරු විසින්ද හඳුනා ගන්නා ලදී. වර්ෂ 2002.01.02 වන දින මේජර් සලේ එනම්, පැ.සා 08 විසින් සාක්ෂිකරුට දැනුම් දී ඇත්තේ මිලේනියම් සිටි නිවාසය පොලීසියෙන් පැමිණ මෙහෙයුමක් සිදු කර ඇති බවයි. සාක්ෂිකරු ඒ සම්බන්ධයෙන් හමුදාපති දැනුවත් කර හමුදාපතිවරයාගේ උපදෙස් මත මේජර් සලේ සමග පස්වරු 06.30 ට පමණ එම ස්ථායට ගිය බව පවසන ලදී.

කෙසේවෙතත් සාක්ෂිකරු ඇතුළු නිලධාරීන් එම ස්ථානයට යන විට මිලේනියම් සිටි නිවාසයේ සිටි හමුදා නිලධාරීන් සහ සිවිල් පුද්ගලයන්ද රැගෙන නාරාහේන්පිට යුධ හමුදා පොලීසියට රැගෙන ගොස් ඇති බවට දැනගෙන ඇත. සාක්ෂිකරු නාරාහේන්පිට යුධ හමුදා පොලීසියට ගොස් ඇති අතර ඒ වන විට ජන මාධ්‍යවේදීන්ද එම ස්ථානයට පැමිණ සිටි බව සාක්ෂිකරු පවසන ලදී.

සාක්ෂිකරු චූදිතට දැනුම් දී ඇත්තේ මෙම ස්ථානය නීත්‍යානුකූලව පවත්වාගෙන ගිය බවත්, මේ පිළිබඳව ප්‍රසිද්ධ නොකරන ලෙසත්ය.

ඒ සමගම සාක්ෂිකරු පොලිස්පතිවරයා සමගද දුරකථනයෙන් කතා කර ඇති අතර පොලිස්පතිවරයා චූදිත සමග සාකච්ඡා කල බව පවසන ලදී.

කෙසේවෙතත් චූදිත පවසා ඇත්තේ මිලේනියම් සිටි නිවාස ස්ථානයේ තිබී භාරයට ගත් අවි ආයුධ සම්බන්ධයෙන් ඒවා නීත්‍යානුකූල බවට ලිපියක් ඉදිරිපත් කරන්නේ නම් ගිනිඅවි සහ හමුදා නිලධාරීන්ද නිදහස් කරන බවයි. ඒ අනුව ලියුමක් පිළියෙල කර නීති අංශයේ කපිතාන් සමන් කුමාර මහතා භාරයේ චූදිත වෙත යොමු කල බව සාක්ෂිකරු පවසන ලදී. ඊට අදාල පිටපත පැ. 09 වශයෙන් ලකුණු කරන ලදී.

සාක්ෂිකරු පවසා සිටියේ පසු දින මෙම ලිපිය මහනුවරදී භාර දුන් බව දැනගත්තද යුධ හමුදා නිලධාරීන් හෝ ගිනිඅවි මුදා නොහල බවයි.

සාක්ෂිකරු වැඩිදුරටත් පවසා සිටියේ පසුව මෙම පිරිස පොලීසියෙන් මුදා හැරියද එසේ පොලිස් භාරයට පත් වූවන්ගෙන් කීප දෙනෙකු LTTE සංවිධානය මගින් මරා දැමූ බවත්, යුධ හමුදා බුද්ධි අංශය දැඩි ලෙස කලකිරීමට පත් වූ බවත්ය.

විත්තිය වෙනුවෙන් හරස් ප්‍රශ්න අසමින් සාක්ෂිකරුට යෝජනා කලේ පැ. 09 දරණ ලේඛනය කිසිදු අවස්ථාවක චූදිතට භාර නොදුන් බවයි. සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කරන ලදී.

විත්තියේ හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී සාක්ෂිකරු විසින් යුධ හමුදා පොලිස් මූලස්ථානයේදී මෙම ස්ථානය නීත්‍යානුකූලව පවත්වාගෙන ගිය බවට චූදිතට දැනුම් දුන්නේය යන කරුණ කිසිදු ආකාරයකට අභියෝගයට ලක් වී නැත.

<u>**පැමිණිල්ලේ සාක්ෂි අංක 08**</u>

තුවාන් සුරේෂ් සලේ නමැති මෙම සාක්ෂිකරු 1987.03.16 වන දින උප ලුතිනන් වරයෙකු වශයෙන් යුධ හමුදාවට බැදී ඇති අතර 1993 සිට යුධ හමුදා බුද්ධි අංශයට අනුයුක්තව රාජකාරී කර ඇත. ඔහුද පවසා සිටියේ කපිතාන් නිලාම් ඇතුළු අය යුධ හමුදාවේ බුද්ධි අංශයට අනුයුක්තව රාජකාරී කල බවයි. කපිතාන් නිලාම් ආරක්ෂක නිවස්නයක අවශ්‍යතාවය බුද්ධි අංශයට පැහැදිලි කර දී තිබූ හෙයින් ඒ පිළිබඳව බ්‍රිගේඩියර් හෙන්දාවිතාරණ සමග සාකච්ඡා කර මෙම නිවස තෝරා ගත් බව සාක්ෂිකරු පවසයි. එම නිවස කපිතාන් නිලාම්ගේ බිරිඳට අයත් නිවසක් බව ඔහු දැන සිටි බව පවසන ලදී. මීට අදාලව ලකුණු කර තිබූ පැ. 08 දරණ ලේඛනය සාක්ෂිකරු හඳුනා ගන්නා ලදී. 2002.02.02 වන දින කපිතාන් නිලාම්ගේ බිරිඳ සාක්ෂිකරුට දුරකථනයෙන් කතා කර පවසා ඇත්තේ

පොලිසියෙන් පැමිණ කපිතාන් නිලාම් ඇතුළු පිරිස පොලිසියෙන් රැගෙන යැමට උත්සාහ කරන බවයි.

ඒ අනුව සාක්ෂිකරු බුද්ධි අධ්‍යක්ෂකට දැනුම්දී ඇති අතර ඔහුගේ ඉල්ලීම මත සාක්ෂිකරුද අතුරුගිරියේ පිහිටි මෙම නිවසට පිටව ගොස් ඇත. එම ස්ථානයට ගිය විට ඔවුන් නාරාහේන්පිට යුධ හමුදා පොලිසියට රැගෙන ගොස් තිබූ බව දැනගෙන ඇත. එම ස්ථානයට යන විට මාධ්‍යවේදීන් පැමිණ තිබූ හෙයින් ඒ පිළිබඳව යුධ හමුදාපතිවරයා දැනුවත් කිරීමට පියවර ගෙන ඇත. එසේම එම ස්ථනයට විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරීද පැමිණ සිටි බවත්, සාක්ෂිකරු, බ්‍රිගේඩියර් හෙන්දාවිතාරණ පොලිස්පතිතුමා සහ යුධ හමුදාපතිවරයා දැනුවත් කිරීමට පියවර ගෙන ඇත. කෙසේවෙතත් එම නිලධාරීන්ද රැගෙන චූදිත මහනුවර බලා පිටව ගිය බව වැඩිදුරටත් පවසන ලදී. ඉන් පසු පැ. 09 දරණ ලේඛනය රැගෙන පසු දින මහනුවරට ගොස් චූදිතට භාර දුන් බව පවසන ලදී. මෙම සිද්ධිය හේතුවෙන් මෙම ආරක්ෂක නිවස්නයේ සිටි කීප දෙනෙකු LTTE සංවිධානයෙන් ඝාතනය කල බවද, මේජර් නිලාම්ගේ ආරක්ෂාව සඳහා ඔහු යුරෝපයේ රටකට පිටකර යැවීමට සිදුවූ බවද පවසන ලදී.

විත්තියේ හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් පැ. 09 දරණ ලේඛනය චූදිතට භාර නොදුන් බවටද යෝජනා කරන ලදී. සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කරන ලදී.

## පැමිණිල්ලේ සාක්ෂි අංක 11

විශ්‍රාමික බ්‍රිගේඩියර් ඇලෙක්සැන්ඩර් ධර්මරත්න 2002.01.02 දින වන විට යුධ හමුදා පොලීසියේ නාරාහේන්පිට සේනා විධායක සහ අණ දෙන නිලධාරී වශයෙන් කටයුතු කර ඇත. ඔහුගේ ආසන්නම ඉහළ නිලධාරියා වශයෙන් මේජර් ජනරාල් අයිවන් දසනායක කටයුතු කර ඇත. 2002.01.02 දින පෙ.ව 10.00 ට පමණ යුධ හමුදා මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් දැනුම් දී ඇත්තේ මහනුවර උඩතලවින්න සමූහ මිනිස් ඝාතනය සම්බන්ධයෙන් අවශ්‍ය කරන හමුදා නිලධාරියෙක් අත්අඩංගුවට ගැනීම සඳහා මේජර් ඒ.සී.ඒ ද සොයිසා, සහකාර පොලිස් අධිකාරී උඩුගම්පල එනම්, මෙම නඩුවේ චූදිතට සහාය සඳහා ලබා දෙන ලෙසයි. මෙම ඉල්ලීම වාචිකව සිදු කල බවද, ලිඛිත ඉල්ලීමක් සිදු කර නොමැති බවද පවසන ලදී. එම අවස්ථාවේදී අත්අඩංගුවට ගැනීමට යෝජිත නිලධාරියාගේ නම, ඒකකය සහ ලිපිනය සාක්ෂිකරු විසින් මේජර් ජනරාල් අයිවන් දසනායකගෙන් ඉල්ලා ඇත. කෙසේවෙතත් එම තොරතුරු හෙළිදරව් කිරීමට චූදිත කැමැත්තක් නොදක්වන බව පවසා ඇත. මෙම කරුණ සහතික කිරීම සඳහා සාක්ෂිකරුගේ අවධානය සඳහා Daily occurrence පොත ඉදිරිපත් කරන ලදී. පස්වරු 4.00 ට පමණ සහකාර පොලිස් අධිකාරී උඩුගම්පල සාක්ෂිකරුට මුණගැසී ඇති අතර මේ පිළිබඳව කටයුතු කිරීමට තමාට මේජර් පොඩි රාලහාමි යන අය උපදෙස් දී තිබූ හෙයින් චූදිත පැමිණි පසු නැවත මේජර් ජනරාල් අයිවන්

දසනායක දැනුවත් කර ඇත. ඒ අනුව මේජර් සොයිසාගේ සහාය චූදිතට ලබා දීමට පියවර ගෙන ඇත.

පසුව රාත්‍රී 09.00 ට පමණ මේජර් පොඩි රාළහාමි සාක්ෂිකරුට දැනුම් දී ඇත්තේ කපිතාන් නිලාම් සහ කණ්ඩායම අවි ආයුධ සමග නාරාහේන්පිට යුධ හමුදා පොලිස් මූලස්ථානයට රැගෙනවිත් ඇති බවයි. ඒ අනුව සාක්ෂිකරු විසින් මේජර් අයිවන් දසනායකට දැනුම් දුන්නද, ඔහු සාක්ෂිකරුට පවසා ඇත්තේ මේ පිළිබඳව යුධ හමුදාපතිවරයා දැනුවත් කරන ලෙසයි.

පසුව සාක්ෂිකරු ඇතුළු නිලධාරීන් කීප දෙනෙකු මෙම ස්ථානයේ නීත්‍යානුකූල භාවය පිළිබඳව චූදිතට දැනුම් දී කපිතාන් නිලාම් ඇතුළු පිරිස රැගෙන නොයන ලෙසට දැනුම් දී ඇත. නමුත් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර රාත්‍රී 11.45 ට පමණ ගිනිඅවි සහ කපිතාන් නිලාම් ඇතුළු පිරිස රැගෙන යුධ හමුදා පොලිස් මූලස්ථානයෙන් පිටව ගොස් ඇත.

පසු දින අළුයම 01.30 ට පමණ සාක්ෂිකරු විසින් යුධ හමුදාපතිවරයාට මේ පිළිබඳව සම්පූර්ණයෙන් විස්තර කර ඇත. මේ සම්බන්ධයෙන් සාක්ෂිකරු දෛනික සිදුවීම් පොතේ සටහනක් තබා ඇත.

සාක්ෂිකරු පවසන්නේ මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් යුධ හමුදාපතිවරයා විසින් මූලික පරීක්ෂණ උසාවියක් පත් කල බවත්, සාක්ෂිකරු එහි සාමාජිකයෙකු වූ බවත්ය. ඒ අනුව එවකට විනයාරක්ෂාධිපති වශයෙන් කටයුතු

කළ මේජර් ජනරල් අයිවන් දිසානායක එම තනතුරෙන් ඉවත් කර 2004.03.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම ගැන්වීමට පියවර ගෙන ඇත.

**<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 09</u>**

පැමිණිල්ලේ සාක්ෂි අංක 09 සමන් කුමාර මහතා 2021.11.30 දින සාක්ෂි දෙන අවස්ථාව වන විට පානදුර මහාධිකරණ විනිසුරුවරයා වශයෙන් කටයුතු කරන ලදී. මෙම නඩුවට අදාල සිද්ධිය සිදු වන කාලසීමාව වන විට එනම්, 2002.01.02 දින වන විට ඔහු යුධ හමුදාවේ නීති අධ්‍යක්ෂක මණ්ඩලයට අනුයුක්තව කපිතාන්වරයෙකු වශයෙන් සේවය කර ඇත. 2002.01.02 දින රාත්‍රී කාලයේදී නීති අධ්‍යක්ෂක බ්‍රිගේඩියර් මොහාන්ති පීරිස් මහත්මිය නඩු කටයුත්තක් සම්බන්ධයෙන් මහනුවර ප්‍රදේශය බලා පිටත්ව යාමට සිදු වන බවත්, එයට සූදානම් වන ලෙසත් දැනුම් දී ඇත. ඒ අනුව පසු දින එනම්, ජනවාරි 03 වන දින කාර්යාල වේලාවට පෙර යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක බ්‍රිගේඩියර් හෙන්දාවිතාරණ මහතා මුණගැසී ඇත. ඒ අනුව එදින මහනුවරට ගොස්, ප්‍රථමයෙන් මහනුවර පොලිස් මූලස්ථානයට ගොස් පෙර දින රැගෙන ගිය යුධ හමුදා නිලධාරීන් සිටින්නේද යන්න සොයා බලා ඇත. එම ස්ථානයේ නොසිටි හෙයින් කටුගස්තොට පොලීසියට ගොස් ඇති අතර එහිද නොසිටි හෙයින් තෙල්දෙණිය මහේස්ත්‍රාත් අධිකරණයේ සිටින බවට ලද තොරතුරක් අනුව තෙල්දෙණිය මහේස්ත්‍රාත් අධිකරණයේ පැවැත්වූ පන්විල සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයට ගොස් ඇත. කෙසේවෙතත් පෙර දින රැගෙන ගිය යුධ හමුදා

නිලධාරීන් සොයා ගැනීමට නොහැකි වූ හෙයින් සාක්ෂිකරු යටිනුවර වීදියේ ඇති දෙවන සිංහ රෙජිමේන්තු කඳවුරට පැමිණ ඇත. එම ස්ථානයේ සිටින විට ඉහත සඳහන් යුධ හමුදා සාමාජිකයින් මහනුවර පොලීසියේ නිල සුනඛ අංශයේ රඳවා සිටින බවට ලද තොරතුරක් අනුව එම ස්ථානයට ගොස් ඇත. ඒ අනුව එම නිලධාරීන් අත්අඩංගුවට ගත් නිලධාරීවරයා සමග සාකච්ඡා කර ඇත. එහිදී චූදිත පවසා ඇත්තේ මෙම නිලධාරීන් යුධ හමුදාවේ නීත්‍යානුකූල රාජකාරියක යෙදී සිටි බවට ලිඛිත තහවුරු කිරීමක් කරන්නේ නම් ඔවුන්ව මුදා හැරිය හැකි බවයි. මේ පිළිබඳව සාක්ෂිකරු යුධ හමුදා මූලස්ථානයට දැනුම්දී ඇති අතර ඒ අනුව යුධ හමුදා මූලස්ථානයෙන් සාක්ෂිකරු කොළඹට කැඳවා ඇත. ඒ අනුව නැවත 2002.01.04 දින මහනුවරට ගොස් ඉහත කී යුධ හමුදා සාමාජිකයින් නීත්‍යානුකූල රාජකාරියක් කල බවට තහවුරු කරමින් ලිපියක් රැගෙනවිත් චූදිතට ලබා දීමට පියවර ගන්නා ලෙසට උපදෙස් දී ඇත. ඒ අනුව පැ. 09(1) ලෙස ලකුණු කරන ලද ලිපිය රැගෙන මේජර් සලේ සමග පොලිස් නිල සුනඛ අංශයට ගොස් උඩුගම්පල මහතාට ලබා දී ඇත. ඔහු එම ලිපිය මේස ලාච්චුවක තබා ඇති අතර විමර්ශන කටයුතු අවසන්ව නොමැති හෙයින් ඔවුන් මුදා හැරීමට හැකියාවක් නොමැති බවට දන්වා ඇත.

විත්තිය වෙනුවෙන් සාක්ෂිකරුට යෝජනා කලේ සාක්ෂිකරු පැවසූ ආකාරයට 2002.01.03 හෝ 04 දිනයන් හිදී සාක්ෂිකරුට චූදිත මුණ නොගැසුණු බවයි. සාක්ෂිකරු එකී යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදී.

## පැමිණිල්ලේ සාක්ෂි අංක 12

විශ්‍රාමික යුධ හමුදා නිලධාරී පොඩි රාළහාමි 2002.01.02 දින වන විට මේජර් තනතුරේ කටයුතු කර ඇත. ඔහුගේ ආසන්නම අණ දෙන නිලධාරී වශයෙන් කර්නල් ධර්මරත්න කටයුතු කර ඇත. 2002.01.02 වන දින කර්නල් ධර්මරත්න සාක්ෂිකරුට දැනුම් දී ඇත්තේ මේජර් ක්ලිෆර්ඩ් ද සොයිසා, රාජකාරියකට පොලිස් අධිකාරී උඩුගම්පල මහතා සමග යැම සඳහා සූදානම් කරන ලෙස විනයාරක්ෂක විසින් දැනුම් දී ඇති බවයි. ඒ පිළිබඳව මේජර් සොයිසාට සාක්ෂිකරු විසින් දැනුම් දී ඇත. ඉන් පසු පොලිස් අධිකාරී උඩුගම්පල පැමිණ සාක්ෂිකරු මුණගැසී ඇති අතර ඔහුගෙන් රාජකාරී ස්වභාවය විමසූ විට එය විනයාරක්ෂාධිපතිට දැනුම් දී ඇති බව පවසා ඇත. ඒ අනුව නැවත අණ දෙන නිලධාරීට සාක්ෂිකරු පවසා ඇති අතර අණ දෙන නිලධාරී සාක්ෂිකරුට පවසා ඇත්තේ මැතිවරණ සමයේ උඩතලවින්න ප්‍රදේශයේ සිදු වූ දස මිනී මැරුම් සිද්ධියක් සම්බන්ධයෙන් නිලධරයෙකු අත්අඩංගුවට ගැනීම පොලිස් අධිකාරී උඩුගම්පලගේ රාජකාරිය බවයි.

මේජර් සොයිසා, පොලිස් අධිකාරී උඩුගම්පල සමග පිටව ගොස් රාත්‍රී 09.00 ට පමණ පැමිණ ඇති අතර එහිදී යුධ හමුදා නිලධාරීන් පස් දෙනෙක් හෝ හය දෙනෙක් සමග ද්‍රවිඩ සිවිල් පුද්ගලයෙකුද අත්අඩංගුවට ගෙන රැගෙනවිත් ඇත.

එම අවස්ථාවේදී කාරාහෙන්පිට යුධ හමුදා පොලිස් මූලස්ථානයට බ්‍රිගේඩියර් හෙන්දාවිතාරණ, විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරී සහ අභ්‍යන්තර ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ලාල් පෙරේරා මහතා පැමිණ සිට ඇත.

එම අවස්ථාවේදී චූදිත සහ ඉහත නිලධාරීන් අතර වූ සාකච්ඡාව කුමක්ද යන්න තමන් නොදන්නා බව පවසන ලදී. එසේම නාරාහේන්පිට කඳවුරට සිරස මාධ්‍ය ආයතනයේ කණ්ඩායමක්ද පැමිණ සිට ඇත. නමුත් ඔවුන්ට කඳවුර තුළට පැමිණීමට අවසර ලබා දී නැත. මේ සම්බන්ධයෙන් විනයාරක්ෂාධිපතිට දැනුම් දුන්නද ඔහු ඒ වන විට ගමනක් යන බව පවසා අණ දෙන නිලධාරීට දැනුම් දෙන ලෙසට සාක්ෂිකරුට උපදෙස් දී ඇත. ඒ අනුව සාක්ෂිකරු අණ දෙන නිලධාරීට දැනුම් දී ඇති අතර ඔහුගේ උපදෙස් මත සියළු සිදුවීම් දෛනික සිදුවීම් පොතේ සටහන් කර ඇත.

**<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 10</u>**

පැමිණිල්ලේ සාක්ෂි අංක 10 සාක්ෂි දෙන අවස්ථාව වන විට බ්‍රිගේඩියර් තනතුර දැරූ ක්ලිෆර්ඩ් ද සොයිසා වර්ෂ 2002.01.02 දින වන විට ශ්‍රී ලංකා යුධ හමුදා පොලීසියේ විශේෂ විමර්ශන ඒකකයේ රාජකාරී කර ඇත. එම කණ්ඩයේ අණ දෙන නිලධාරී ලෙස කර්නල් ධර්මරත්න සහ දෙවන අණ දෙන නිලධාරී ලෙස මේජර් පොඩි රාළහාමි කටයුතු කර ඇත. ජනවාරි දෙවන දින පස්වරු

04.00 ට පමණ මේජර් පොඩි රාළහාමි, සාක්ෂිකරු කාර්යාලයට කැඳවා පොලිස් අධිකාරී උඩුගම්පල මහතාගේ රාජකාරී සඳහා සහයෝගය ලබා දෙන ලෙසට දැනුම් දී ඇත. ඒ අනුව මැතිවරණ සමය තුළ සිදු වුණු දස පුද්ගල ඝාතන සම්බන්ධයෙන් අවශ්‍ය කරන යුධ හමුදා නිලධරයෙකු අත්අඩංගුවට ගැනීම සඳහා නිල ඇඳුමින් පොලිස් පරීක්ෂක උඩුගම්පල සමග පිටව ගොස් ඇත. පොලිස් අධිකාරී උඩුගම්පල එනම්, චූදිත සාක්ෂිකරුට පවසා ඇත්තේ කපිතාන් නිලාම් නමැති නිලධාරියා සම්බන්ධයෙන් සොයා බලන බවයි. ඒ අනුව මිලේනියම් සිටි නිවාස සංකීර්ණයට ගොස් ඇති අතර මිලේනියම් සිටි නිවාස සංකීර්ණය තුළ වූ කාර්යාලය වෙත ගොස් විමසීමක් කර ලබා ගත් තොරතුරු අනුව යම් නිවසක් වෙත ගොස් ඇත. ඒ අනුව නිවෙස් පේළියක එක නිවසක් ඉදිරිපිට පුද්ගලයෙකු සිට ඇත. ඒ අනුව එම නිවස පරීක්ෂා කර ඇති අතර එහි එක් කාමරයක් යතුරු දමා තිබී ඇත. නිවස ඉදිරිපිට සිටි පුද්ගලයාට එය විවෘත කරන ලෙස පැවසූ පසු එම යතුර කපිතාන් නිලාම් භාරයේ ඇති බවට පවසා ඇත. ටික වේලාවකින් කපිතාන් නිලාම් එම ස්ථානයට පැමිණ ඇති අතර චූදිත ඔහු සමග සාකච්ඡා කර එම කාමරයේ යතුර ඉල්ලූ පසු බුද්ධි අධ්‍යක්ෂකගෙන් අවසර ලබාගත යුතු බව දැනුම් දී දුරකථනයෙන් කතා කිරීමට අවශ්‍ය බව පවසා ඇත. ඒ සඳහා අවසරය ලබා දී නොමැති චූදිත කපිතාන් නිලාම් භාරයේ තිබූ දුරකථනය චූදිත රැගෙන සාක්ෂිකරුට ලබා දී ඇත. පසුව කපිතාන් නිලාම් විසින් කාමරය විවෘත කර දී ඇති අතර ඒ තුළ අවි ආයුධ ප්‍රමාණයක් සහ සලාක ද්‍රව්‍ය තිබී ඇත. සාක්ෂිකරු ඒ පිළිබඳව දෛනික සිදුවීම් පොතේ සටහන් කර තිබී ඇත. එසේ සිටින විට රාත්‍රී

08.00 ත්, 08.15 ත් අතර අතුරුගිරිය පොලීසියේ නිලධාරීන් පැමිණ ඇති අතර චූදිත විසින් එහි තිබූ ආයුධ ලැයිස්තුගත කර අතුරුගිරිය පොලිස් ස්ථානාධිපති රැගෙන එන ලද වාහනයට අවිආයුධ පටවා යුධ හමුදා විශේෂ විමර්ශන ඒකකයට ගොස් ඇත. රාත්‍රී 09.00 ට පමණ යුධ හමුදා විශේෂ විමර්ශන ඒකකයට සාක්ෂිකරු වාර්තා කර ඇත. එහි ගොස් සිටින විට යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක බ්‍රිගේඩියර් හෙන්දාවිතාරණ, විශේෂ කාර්ය බලකායේ නියෝජ්‍ය පොලිස්පති නිමල් ගුණතිලක, අභ්‍යන්තර ආරකෂක අමාත්‍යංශයේ ලේකම් ලාල් රත්නායක යන මහත්තුරුන් පැමිණ ඇත.

## <u>පැමිණිල්ලේ සාක්ෂි අංක 38</u>

මෙම සාක්ෂිකරු සාක්ෂි දෙන අවස්ථාව වන විට විශ්‍රාමික ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකි. 2002.01.02 වන දින අභ්‍යන්තර කටයුතු පිළිබඳ අමාත්‍යවරයාගේ පුද්ගලික ලේකම් ලාල් රත්නායක නමැති අයෙකු විසින් සාක්ෂිකරුට දැනුම් දී ඇත්තේ උඩුගම්පල නමැති පොලිස් නිලධරයෙකු අතුරුගිරියේ පිහිටි යුධ හමුදා නිලධාරීන් පදිංචි නිවාසයකට ගොස් බිහිසුණු අවි ආයුධ තොගයක් සොයාගෙන ඇති බවයි. ප්‍රභූ වරයෙකු ඝාතනය කිරීම සඳහා මෙසේ ආයුධ රැස් කර තිබූ බවට සැකයක් ඇති වූ බැවින් මේ පිලිබඳව මහජනතාවට දැනුම් දීමට පවත්වනු ලබන ප්‍රවෘත්ති සාකච්ඡාවක් සඳහා පොලීසියේ මතය ප්‍රකාශ කිරීමට එම ප්‍රවෘත්ති සාකච්ඡාවට සහභාගී වන ලෙසට දැනුම් දී ඇත.

කෙසේවෙතත් මෙම සිදු වූ සිද්ධිය යුධ හමුදාවේ ගෞරවයට සහ කීර්තියට විශාල ලෙස හානි වන කරුණක් වන හෙයින් මාධ්‍යට ඒ පිළිබඳව ප්‍රකාශයක් කළ නොහැකි බවට දැනුම් දී ඇත.

එසේම පොලිස් අධිකාරී උඩුගම්පල මහතා විසින් කරනු ලබන පරීක්ෂණය නිසි ලෙස අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කළයුතු බවට ඇමතිවරයා විසින් සාක්ෂිකරුට දැනුම් දී ඇත. ඒ අනුව සාක්ෂිකරු විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ එවකට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සමරතුංග ඇතුළු නිලධාරීන් පිරිසක් යොදවාගෙන ඇත.

එම පරීක්ෂණයෙන් පසු සාක්ෂිකරු විසින් 2002.01.29 වන දින වාර්තාවක් පිළියෙල කර අභ්‍යන්තර කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ ලේකම්වරයාට දැනුම් දී ඇත. එකී වාර්තාව නඩු විභාගයේදී පැ. 12 ලෙස ලකුණු කරන ලදී. ඒ අනුව චූදිත විසින් හිතුවක්කාරී ලෙස කටයුතු කර මෙම නිලධාරීන් පිරිස අත්අඩංගුවට ගෙන ඇති බවට වාර්තා කර ඇත.

සාක්ෂිකරු වැඩිදුරටත් පවසා සිටියේ මෙම කාලසීමාව වන විට ශ්‍රී ලංකා රජය සහ LTTE සංවිධානය අතර ඒකපාර්ශ්වික  සටන් විරාමයක් ප්‍රකාශයට පත් කර ඇති හෙයින් එවකට පැවති රජය අප රටේ භෞමික අඛණ්ඩතාවයට හානි වන ආකාරයෙන් කටයුතු කල බවයි. එසේම තම නිර්දේශයන්ට පටහැනිව චූදිත අත්තනෝමතික ලෙස කටයුතු කල බවද සාක්ෂිකරු පවසන ලදී.

## පැමිණිල්ලේ සාක්ෂි අංක 40

විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සමරතුංග වර්ෂ 2002 වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්තව රාජකාරී කර ඇත. 2002.01.05 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරව සිටි නියෝජ්‍ය පොලිස්පති පුණ්‍යා ද සිල්වා සාක්ෂිකරුට දුරකථනයෙන් දැනුම් දී ඇත්තේ එදින පෙ.ව. 10.00 ට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති - අපරාධ සහ මෙහෙයුම් කොටකදෙණිය හමුවන ලෙසයි. ඒ අනුව සාක්ෂිකරු තවත් නිලධරයෙකු සමග ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කොටකදෙණිය ඔහුගේ කාර්යාලයේදී මුණ ගැසී ඇත. ඒ අනුව මිලේනියම් සිටි සිද්ධියේ අත්අඩංගුවට අරගෙන සිටි යුධ හමුදා සැකකරුවන් මහනුවර කොට්ඨාශයේ රඳවාගෙන සිටින  බව පවසා ඔවුන්ගෙන් ප්‍රශ්න කර මහනුවර එකී පරීක්ෂණය භාරව සිටි  උඩුගම්පල මහතාට උදව් කරන ලෙසටත්, එම අවි ආයුධ නීත්‍යානුකූලව ගෙන ගොස් තිබේද යන්න සම්බන්ධයෙන් මූලික වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසටත් දැනුම් දී ඇත.

2002.01.08 වන දින එවකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අශෝක විජේතිලක ලිඛිතව දැනුම් දීමක් කර ඇති අතර එකී ලිඛිත දැනුම්දීම මහනුවර ප්‍රදේශය භාර නියෝජ්‍ය පොලිස්පති බාලසූරිය මහතාටද පිටපත් කර ඇත. එකී ලිඛිත දැනුම් දීම අනුව සාක්ෂිකරු හට සහාය දක්වන ලෙස දැනුවත් කර ඇත.

සාක්ෂිකරු විසින් මීට අදාල විමර්ශනය ලියාපදිංචි කර ඒ සඳහා අවශ්‍ය නිලධාරීන් පිරිස තෝරාගෙන ඇත. සාක්ෂිකරුට අනුව විමර්ශනයේ මූලික අරමුණ වී ඇත්තේ මිලේනියම් සිටි හි තිබූ අවි ගබඩාව පවත්වාගෙන ගිය ස්ථානය නීත්‍යානුකූලව ලබා ගත් එකක්ද, එහි වූ අවි ආයුධ නීත්‍යානුකූලව භාර දුන් ඒවාද යන්න සම්බන්ධයෙන් මූලික වාර්තාවක් පිළියෙල කිරීම වේ.

ඒ අනුව සාක්ෂිකරු 2002.01.08 වන දින තම පොලිස් කණ්ඩායම සමග මහනුවර කටුගස්තොට පොලිස් ස්ථානයට ගොස් එහි රඳවාගෙන සිටි යුද හමුදා නිලධාරීන් සහ සිවිල් පුද්ගලයෙකුගේ ප්‍රකාශ සටහන් කරගෙන ඇත. එම ප්‍රකාශ සටහන් කර ගැනීම සාක්ෂිකරුගේ මූලිකත්වයෙන් වෙනත් නිලධාරීන් විසින් සිදු කර ඇත. එම කර්තව්‍ය අවසානයේදී කොළඹට පැමිණ බ්‍රිගේඩියර් කපිල හෙන්දාවිතාරණගේ ප්‍රකාශය සටහන් කරගෙන ඇත. බ්‍රිගේඩියර් කපිල හෙන්දාවිතාරණ විසින් මිලේනියම් සිටි නිවාසයට අවි භාර දීම සම්බන්ධ ලේඛන ගොනුවක් සාක්ෂිකරුට ඉදිරිපත් කර ඇත. සාක්ෂි දුන් දිනය වන විට මෙම සාක්ෂිකරුට ඔහු විසින් පරීක්ෂා කරන ලද ලේඛන පිළිබඳ මතක නැති බව පවසන ලදී.

සාක්ෂිකරු විසින් මූලික විමර්ශනය අවසානයේ පිළියෙල කරන ලද වාර්තාව හඳුනා ගත් අතර එය පැ. 14 වශයෙන් ලකුණු කරන ලදී.

විත්තියේ හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු පවසා සිටියේ උඩතලවින්න ඝාතනය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂණයක් කල නමුත් එයට තමා සහභාගී නොවූ බවයි. සාක්ෂිකරු විසින් නඩු භාණ්ඩ හෝ අවි ආයුධ පරීක්ෂා නොකල බවද, රැඳවුම් භාරයේ සිටි පුද්ගලයන්ගේ ප්‍රකාශ සටහන් කර ගැනීමත්, මේජර් ජනරාල් හෙන්දාවිතාරණගේ ප්‍රකාශයක් සටහන් කර ගැනීමත් හැර ස්වාධීන විමර්ශනයක් සිදු නොකල බවත් පවසයි. ඉහත සඳහන් ප්‍රකාශ අනුව තම වාර්තාව පිළියෙල කල බවද සාක්ෂිකරු පවසන ලදී.

**<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 63</u>**

ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස විශ්‍රාම ගත් මෙම සාක්ෂිකරු වසර 27 ක පමණ කාලයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්තව රාජකාරී කර ඇත. සාක්ෂිකරු මෙම සිද්ධියට අදාල විමර්ශනය 2004.02.17 සිදු කර ඇත. ඒ අනුව සාක්ෂිකරු විසින් අතුරුගිරියේ මිලේනියම් සිටි නිවාසය පරීක්ෂා කර ඉන් පසු මෙම නිවාසයේ හිමිකම පිළිබඳව පරීක්ෂා කර ඇති අතර නිවාසය කපිතාන් නිලාම් නමැති අයගේ බිරිඳට අයත් නිවාසයක් බව අනාවරණය කරගෙන ඇත. ඊට අමතරව සාක්ෂිකරුවන් ගණනාවකගේ ප්‍රකාශ සටහන් කරගෙන ඇත. චූදිතගේ ප්‍රකාශයද, මේජර් ක්ලිෆර්ඩ් සොයිසා ඇතුළු නිලධාරීන්ගේ ප්‍රකාශද සටහන් කරගෙන ඇත. එසේ සටහන් කර ගත් ප්‍රකාශ අතර මේජර් ජනරාල් අයිවන් දසනායක, එවකට මහේස්ත්‍රාත් සමන් කුමාර,

නියෝජ්‍ය පොලිස්පති නිමල් ගුණතිලක, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සමරතුංග, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහින්ද බාලසූරිය, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අශෝක රත්නවීර යන අයවළුන්ගේ ප්‍රකාශ වේ. මීට අමතරව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කොටකදෙණිය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති වෙත යවන ලද සටහනක්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සමරතුංග විසින් ඉංග්‍රීසියෙන් යවන ලද වාර්තාවේ පිටපතක්, ඉන් පසු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කොටකදෙණිය විසින් අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත යවන ලද වාර්තාවේ පිටපතක් භාරගෙන ඇත. මීට අදාල ලේඛන භාර ගැනීම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂක වානක ද සිල්වා විසින් සිදු කර ඇත.

චූදිතගේ ප්‍රකාශ කීපයක් සටහන් කරගෙන 2005.03.23 වන දින සාක්ෂිකරු විසින් චූදිත අත්අඩංගුවට ගෙන ඇත. ඉන් පසු ඔහු මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇත. ඒ සඳහා උපදෙස් ලබා දී ඇත්තේ නීතිපතිවරයා විසින් බව සාක්ෂිකරු පවසයි.

## <u>පැමිණිල්ලේ සාක්ෂි අංක 68</u>

විශ්‍රාමික උප පොලිස් පරික්ෂකවරයෙකු වන ෂෙරිල් සමරසිංහ මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්තව රාජකාරී කර ඇත. ඔහු

පොලිස් පරීක්ෂක කරුණාරත්නගේ උපදෙස් මත මෙම විමර්ශනයේදී ප්‍රකාශ 30 ක් සටහන් කරගෙන ඇත. එසේම පොලිස් අංශ භාරයේ තිබූ යම් යම් ලේඛන භාරයට ගෙන ඇත. ඒ අනුව මහනුවර නිල සුනඛ අංශයේ 2001.12.15 දින සිට 2001.12.26 දක්වා පවත්වාගෙන යන ලද RIB පොත, 2001.12.26 සිට 2002.01.04 දින දක්වා වූ තොරතුරු සටහන් පොත් දෙක, නිල සුනඛ අංශයේ පවත්වාගෙන ගිය දුකරථන පණිවිඩ බැහැර කිරීම හා ලැබෙන සටහන් ලේඛනය, 2001.10.29 දින සිට 2002.04.19 දක්වා පවත්වාගෙන යන ලද උසස් නිලධාරීන්ගේ ගමන් සටහන් පොත තම භාරයට ගෙන ඇත. එම ලේඛන සාක්ෂිකරු විසින් පසුව නිසි පරිදි උප පොලිස් පරීක්ෂක වානක ද සිල්වාට භාර දී ඇත. පැ. 14 දරණ ලේඛනය සාක්ෂිකරු හඳුනා ගත් අතර සාක්ෂිකරු විසින් හඳුනා ගත් SCR ලේඛනය පැ. 16 වශයෙන් ලකුණු කරන ලදී.

**<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 65</u>**

මෙම සාක්ෂිකරු සාක්ෂි දෙන අවස්ථාව වන විට සහකාර පොලිස් අධිකාරීවරයෙකු වූ අතර වර්ෂ 2004 වසර වන විට උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් කටයුතු කර ඇත. අපරාධ පරක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අශෝක විජේතිලක මහතාගේ උපදෙස් මත පොලිස් පරීක්ෂක කරුණාරත්නගේ ප්‍රධානත්වයෙන් වූ නිලධාරීන් කණ්ඩායමේ සමාජිකයෙකු වශයෙන් 2004.02.16 දින යම් විමර්ශන කටයුත්තකට සහභාගී වී ඇත. එහිදී සාක්ෂිකරු විසින් ලේඛන 33 ක් පමණ

භාරගෙන ඇති අතර විශේෂයෙන්ම පැ. 1 සිට පැ. 10 දක්වා ලේඛන සාක්ෂිකරු විසින් භාරගත් බව පිළිගන්නා ලදී.

විත්තියේ හරස් ප්‍රශ්න වලට පිළිතුරු සපයමින් 2002.01.05 වන දින මහනුවර අපරාධ හා මෙහෙයුම් අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ධර්මරත්න විසින් මිලේනියම් සිටි නිවසේ සිට අත්අඩංගුවට ගත් යුධ හමුදා නිලධාරීන් සහ සිවිල් නිලධාරීන් හට ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව දින 90 ක රැඳවුම් නියෝගයක් ලබා ගැනීම සඳහා මහනුවර ජෝෂ්ඨ පොලිස් අධිකාරී අමතා යවන ලද ලේඛනය සාක්ෂිකරු හඳුනා ගත් අතර එය වි. 01 වශයෙවන් ලකුණු කරන ලදී. එම ලේඛනය ජෝෂ්ඨ පොලිස් අධිකාරී අශෝක රත්නවීර වෙත යොමු කර ඇති අතර අශෝක රත්නවීර මහතා විසින් නියෝජ්‍ය පොලිස්පති මධ්‍යම බටහිර වෙත යොමු කරන ලද ලිපිය වි. 02 ලෙස ලකුණු කරන ලදී. නියෝජ්‍ය පොලිස්පති මධ්‍යම බටහිර විසින් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්වරයා වෙත යොමු කරන ලද ලිපිය වි. 03 ලෙස ලකුණු කරන ලදී.

කෙසේවෙතත් සාක්ෂිකරු පවසා සිටියේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් දින 90 ක රැඳවුම් නියෝගය ලබා දී නොමැති බවයි. ඒ අනුව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්වරයා වන ඔස්ටින් ප්‍රනාන්දු මහතා විසින් නියෝජ්‍ය පොලිස්පති මහින්ද බාලසූරිය අමතා 2002.01.12 යොමු කර ඇති ලිපිය වි. 04 ලෙස ලකුණු කරන ලදී.

## <u>මහාධිකරණ රෙජිස්ට්‍රාර්වරයා වෙනුවෙන් කැඳවන ලද සාක්ෂි</u>

2022.12.14 වන දින කොළඹ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙනුවෙන් සාක්ෂි දීම සඳහා අධිකරණ භාෂණ පරිවර්ථක එම්.එච්.එෆ්.එස් නසීරා මහත්මිය සාක්ෂි දෙන ලදී. ඒ අනුව පන්විල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක NSP 684/2001 නඩුව පැ. 17 වශයෙන් ලකුණු කරන ලදී. 2001.12.31 වන දින නියෝගය පැ. 17අ වශයෙන් ලකුණු කරන ලදී. මහුනවර මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක 12056 නඩු වාර්තාව පැ. 18 ලෙස ලකුණු කල අතර එහි චෝදනා පත්‍රය පැ. 18(1) වශයෙන් ලකුණු කරන ලදී. එම නඩුව අනුව චූදිතයින් අට දෙනෙකු නම් කර ඇත. ඔවුන්ට දණ්ඩ නීති සංග්‍රහයේ 279 වගන්තිය යටතේ චෝදනා ඉදිරිපත් කර ඇත. එහි චූදිතයන් වන්නේ, 01. මොහොමඩ් නිලාම්, 02. ඉලන්දරගේ එදිරිසිංහ ජයමාන්න, 03. ප්‍රේම ආනන්ද උදලාගම, 04. මොහොමඩ් හිල්මි, 05. නිශ්ශංක හේරත්, 06. රාසරත්නම් සුභාෂ්කරන්, 07. කපිල ගාමිණී හෙන්දාවිතාරණ, 08. ලයනල් පියනන්ද බලගල්ල යන අයවළුන් වේ. 2002.01.07 වන දින එම නඩුව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ කැඳවන ලද අවස්ථාවේදී පහත සඳහන් නියෝගය සටහන් කර ඇති බව සාක්ෂිකාරිය පවසන ලදී.

**"සැකකරුවන් නිල මැදිරියට ඉදිරිපත් කරයි. ඉල්ලීම පරිදි රැඳවුම් නියෝගය මත කටුගස්තොට පොලිස් ස්ථානයේ රඳවා තැබීමට සහ**

**විමර්ශන කටයුතු අවසන් කර අධිකරණයට ඉදිරිපත් කිරීමටද අපරාධ සහ මෙහෙයුම් අංශය මහනුවර ස්ථානාධිපති වෙත නියෝග කරමි.”**

2002.01.07 දිනට අදාල වැඩිදුර වාර්තාව පැ. 18(3) වශයෙන් ලකුණු කරන ලදී.

සාක්ෂිකාරිය විත්තියේ හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් පැ. 17අ ලෙස ලකුණු කරන ලද කාර්ය සටහනට අදාල වැඩිදුර වාර්තාව පොලිස් පරීක්ෂක අසේල ඉන්ද්‍රජිත් නමැති අයෙකු සහතික කර ඇති බව පවසන ලදී. පැ. 18 දරණ ලේඛනය මහනුවර අපරාධ හා මෙහෙයුම් අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ධර්මරත්න විසින් අත්සන් කර ඇති බවත්, පැ. 18-3 දරණ වාර්තාවද ධර්මරත්න නමැති පොලිස් නිලධාරියා විසින් අත්සන් කර ඇති බවත් පවසන ලදී. පැ. 18 දරණ වාර්තාවේ චූදිතයින් නිදහස් කිරීමේ නියෝගයක් 2003.01.24 වන දින සටහන්ව ඇති බව සාක්ෂිකාරිය පිළිගත් අතර එය පැ. 18(4) වශයෙන් ලකුණු කරන ලදී.

## <u>චූදිතගේ සාක්ෂිය</u>

2023.05.02 වන දින චූදිත සාක්ෂි දීම ආරම්භ කල අතර ඔහු වැඩ තහනමට ලක් වන විට සහකාර පොලිස් අධිකාරී ධූරයේ රාජකාරී කල බව පවසයි. ඔහු පොලිස් සේවයට බැදී ඇත්තේ වර්ෂ 1978 දී වේ. වර්ෂ 2001.06 වන

මාසයේ සිට මහනුවර පොලිස් නිල සුනඛ අංශයට අනුයුක්තව පොලිස් අධිකාරීවරයෙකු වශයෙන් කටයුතු කර ඇත. එවකට එහි නියෝජ්‍ය පොලිස්පති වශයෙන් මහින්ද බාලසූරිය මහතා රාජකාරී කර ඇත. වර්ෂ 2001.11 වන මාසයේ පැවැත්වීමට නියමිතව තිබූ මැතිවරණයකට අදාලව මැතිවරණ අපේක්ෂකයින්ට සහකාර පොලිස් අධිකාරී තනතුරට ඉහළ නිලධාරීන් හට සම්මන්ත්‍රණයක් නියෝජ්‍ය පොලිස්පති මහින්ද බාලසූරියගේ ප්‍රධානත්වයෙන් තිබී ඇත. සාක්ෂිකරු පවසා සිටියේ සහකාර පොලිස් අධිකාරීගෙන් ඉහළ නිලධාරීන් සෑම සතියකට වරක් එම සතියේ සිදුවූ සිදුවීම් සහ කීමට ඇති දේවල් සම්බන්ධයෙන් සති වාර්තාවක් පිළියෙල කර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට යවන බවයි. එය පිටපත් දෙකකින් යුත් ලේඛනයක් වන අතර මුල් පිටපත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට යවන බවත්, කාබන් පිටපත් නිලධාරියා භාරයේ තබා ගන්නා බවත් පවසන ලදී. එම වාර්තාව E 21 දරණ දෙපාර්තමේන්තු නියෝගය ප්‍රකාරව පිළියෙල කරන බව පවසයි. 2001.11.07 පැවති රැස්වීමේදී මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් මැතිවරණ අපේක්ෂකයින් පැමිණිලි කල බව පවසන ලදී. එහිදී සාක්ෂිකරු පවසා ඇත්තේ ඔහුට ලද තොරතුරු අනුව තෙල්දෙණිය මහවැලි ගම්මානයේ නිවාස කීපයක පුද්ගලයින් කලහකාරීව රැදී සිටින බව සහ ඔවුන් අත්අඩංගුවට ගෙන නිරායුධ කර අධිකරණයට ඉදිරිපත් නොකලහොත් මැතිවරණය ආසන්නයේදී කලහකාරී සිද්ධීන් ප්‍රදේශය පුරා ඇති විය හැකි බවත්, එය ඉටු කිරීමට නිලධාරියෙකු නොමැති නම් නිලධාරීන් පිරිසක් සමග තමාට වගකීම පවරන ලෙසත්, එම

පුද්ගලයන් අත්අඩංගුවට ගෙන නිරායුධ කර අධිකරණයට ඉදිරිපත් කිරීමේ වගකීම සාක්ෂිකරු භාර ගන්නා බවත්ය.

ඡන්දය පැවැත්වීමට නියමිතව තිබූ දිනය 2001.12.05 බව සාක්ෂිකරු පවසන ලදී.

2001.11.23 වන දින නැවත සති වාර්තාවක් ඉදිරිපත් කරමින් සාක්ෂිකරු පවසා ඇත්තේ මෙම මැතිවරණය සම්බන්ධයෙන් ඉතා නරක තත්ත්වයක් තිබෙන බවත්, මැතිවරණ දින කිට්ටු වන විට ඉතා භයානක තත්ත්වයක් දිවයිනේ ඇති විය හැකි බවත්ය.

සාක්ෂිකරු මීට පෙර මහනුවර මූලස්ථාන පොලිස් පරීක්ෂක සහ ස්ථානාධිපති කටුගස්තොට වශයෙන් කටයුතු කර තිබූ හෙයින් මෙම තොරතුරු තමාට ලද බව පවසන ලදී. ඉන් පසු සාක්ෂිකරු 2001.12.04 වන දින පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බකමූණ පොලිස් වසමේ මැතිවරණ රාජකාරී සඳහා පිටව ගොස් ඇත.

මේ අතරතුර මහනුවර දිස්ත්‍රික්කයේ වත්තේගම පොලිස් වසමේ උඩතලවින්න ගම්මානයේදී ඡන්ද පෙට්ටියක් රැගෙන ගිය වාහනක් පසුපස ගමන් කල වෑන් රථයක සිටි තරුණයන් කණ්ඩායමකට වෙඩි තබා දස දෙනෙකු ඝාතනය කර තවත් හතර දෙනෙකුට බරපතල තුවාල සිදුවීමක් සිදු වී ඇත.

මේ සම්බන්ධයෙන් 2001.12.15 වන දින මහනුවර කොට්ඨාශයේ පොලිස් අධිකාරී අපරාධ හා මෙහෙයුම් වශයෙන් පොලිස්පතිවරයා විසින් තමා පත් කල බව සාක්ෂිකරු පවසන ලදී. ඊට අදාල අංක AND/MD/ADM/1940/2001 දරණ පණිවිඩය ඔප්පු කිරීමට යටත්ව X.01 ලෙස ලකුණු කරන ලදී. ඊට අමතරව පොලිස්පතිවරයා විසින් එම අංශයට නිලධාරීන් හත්දෙනෙකු නම් කර ඇත. ඒ අනුව උප පොලිස් පරීක්ෂක ධර්මරත්න ඇතුළු කණ්ඩායමක් අනුයුක්ත කර ඇත. ඊට අදාල පොලිස්පතිවරයාගේ නියෝගය X.02 ලෙස ලකුණු කරන ලදී. එසේම 2001.12.17 වන දින උඩතලවින්න සමූහ ඝාතනය සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සඳහා කුරුණෑගල දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති නිමල් මැදිවක මහතාට සහාය දක්වන ලෙසට පොලිස්පතිවරයා විසින් පත් කිරීමක් කර ඇත. ඊට අදාල ලේඛනය X.03 වශයෙන් ලකුණු කරන ලදී. එම ලේඛනය නියෝජ්‍ය පොලිස්පති කෝඹලවිතාන විසින් අත්සන් තබා ඇත. එම නියෝගය නියෝජ්‍ය පොලිස්පති මහින්ද බාලසූරිය වෙත ලැබී ඇති අතර මහින්ද බාලසූරිය විසින් මේ පිළිබඳව සටහනක් යොදා චූදිතට දැනුම් දී ඇත.

ඒ අනුව 2001.12.19 වන දින විමර්ශනය තමා විසින් සිදු කරන බව පවසා වැඩිදුර වාර්තාවක් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 125 වන වගන්තිය යටතේ තෙල්දෙණිය මහේස්ත්‍රාත් අධිකරණයට වාර්තා කර ඇත. මෙම විමර්ශනයේ ප්‍රතිඵලයක් වශයෙන් 2001.12.19 වන දින තෙල්දෙණිය මහේස්ත්‍රාත්වරයාගෙන් සෝදිසි වරෙන්තුවක් ලබාගෙන මහුනවර යටිනුවර වීදයේ සිංහ රෙජිමේන්තු කඳවුර පරීක්ෂා කර ඇත. ඊට අමතරව බ්‍රිගේඩියර්

තම්මිට නමැති නිලධාරියාගේ ප්‍රකාශයක් සටහන් කරගෙන ඇත. ඊට අමතරව එවකට නියෝජ්‍ය ආරක්ෂක ඇමතිවරයා වශයෙන් කටයුතු කරන ලද අනුරුද්ධ රත්වත්තේ මහතාගේ මහයියාව, රත්මල් කන්දේ නිවස සෝදිසි කිරීම සඳහා සෝදිසි වරෙන්තුවක් ලබාගෙන ඇත. ඒ අනුව 2001.12.19 දින හෝ 20 වන දින එම නිවස පරීක්ෂා කල  බව සාක්ෂිකරු පවසයි. ඉන් පසු කුරුණෑගල බෝයගනේ හමුදා කඳවුර සෝදිසි වරෙන්තුවක් මත පරීක්ෂා කර ඇත. එහිදී T56 අවි 29 ක් සමග එක් ලුතිනන්වරයෙකු ඇතුළු 29 දෙනෙකු උඩතලවින්න ඝාතනය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇත. එම අත්අඩංගුවට ගැනීම උප පොලිස් පරීක්ෂක ධර්මරත්න ඇතුළු නිලධාරීන් පිරිසක් විසින් සිදු කර ඇත. මෙම උඩතලවින්න සමූහ ඝාතනය සඳහා සම්බන්ධ වූයේ යැයි කියනු ලබන තෙල් සංස්ථාවේ ජීප් රථයක රියදුරෙකු වශයෙන් කටයුතු කරන ලද හමුදා පොලීසියේ රියදුරෙක් අත්අඩංගුවට ගෙන ඇත. ඊට අමතරව මෙම ඝාතනයට සම්බන්ධ යැයි කියනු ලබන රියදුරන් දෙදෙනෙකු ලුණුගම්වෙහෙර පොලීසියෙන් අත්අඩංගුවට ගෙන තිබී ඇති අතර ඔවුන් භාරගෙන 2001.12.31 වන  දින වැඩිදුර වාර්තාවකින් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇත.

එම වැඩිදුර වාර්තාවෙන්ම සාක්ෂිකරුට ලද තොරතුරක් විභාග කිරීමට යුධ හමුදා පොලීසියේ ක්ලිෆර්ඩ් ද සොයිසා නමැති අයගේ සහාය ලබා දෙන ලෙසට මහේස්ත්‍රාත්වරයාගෙන් ඉල්ලා ඇත. එසේම මුස්ලිම් හමුදා නිලධරයෙකුට අයත් නිවසකට වානුක රත්වත්තේ යන අය පැමිණෙන බවට ලද තොරතුරක් උසස් නිලධාරීන්ගේ ගමන් සටහන් පොතේ සටහන් කර ඇත. ඒ අනුව නියෝජ්‍ය

පොලිස්පති නිමල් මැදිවක මහතාට ඒ පිළිබඳව දැනුම් දී තෙල්දෙණිය මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී. 684/2002 යටතේ ඉල්ලීමක් කරමින් අතුරුගිරිය ප්‍රදේශයේ මුස්ලිම් හමුදා නිලධරයෙකුට අයත් නිවසක් පරීක්ෂා කිරීමට අවශ්‍ය බව දැනුම් දී ඇත.

එකී ඉල්ලීමට අධිකරණයේ අවසරය ලබා දී මේජර් ක්ලිෆර්ඩ් ද සොයිසාගේ සහාය ලබා ගැනීමට අදාලව නියෝගයක් යුධ හමුදාපතිට ලබාදීමටද අධිකරණය පියවර ගෙන ඇත. ඒ පිළිබඳ දැන්නුවද 2002.01.02 වනතුරු හමුදාපතිවරයාගෙන් ප්‍රතිචාරයක් නොලද බව සාක්ෂිකරු පවසයි.

2002.01.02 දින වන විට යුධ හමුදාපතිවරයාගෙන් තොරතුරක් නොලද හෙයින් තොරතුරට අදාල වරද සංඥෙය වරදක් වන හෙයින් හා අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32 වන වගන්තිය ප්‍රකාරව සංඥෙය වරදකට අදාලව පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට වරෙන්තුවක් අවශ්‍ය නොවන හෙයින් අතුරුගිරිය නිවාසය පරීක්ෂා කිරීම සඳහා ජ්‍යොෂ්ඨ පොලිස් අධිකාරීවරයාට දැනුම් දී නිලධාරීන් පිරිසක් සමග පිටව යාමට තීරණය කර ඇත.

ඒ අනුව සාක්ෂිකරු විසින් යුධ හමුදා පොලීසියේ විනයාරක්ෂාධිපති මේජර් ජනරල් අයිවන් දසනායකට දැනුම් දී ඇත. ඒ අනුව සාක්ෂිකරු උඩතලවින්න සමූහ ඝාතනයේ විමර්ශන කටයුතු කරන බව සහ මෙම පරීක්ෂණ කටයුත්තට සහාය ලබා ගැනීම සඳහා මේජර් ක්ලිෆර්ඩ් ද සොයිසා ලබා දෙන

ලෙසත් ඉල්ලා ඇත. ඒ අනුව මේජර් ක්ලිෆර්ඩ් ද සොයිසාගේ සහාය ලබාදීමට මේජර් ජනරාල් අයිවන් දසනායක එකඟ වී ඇත. ඒ අනුව සාක්ෂිකරු නාරාහේන්පිට යුධ හමුදා පොලිස් මූලස්ථානයට ගොස් මේජර් ක්ලිෆර්ඩ් ද සොයිසා මුණගැසී සාක්ෂිකරු ගමන් ගත් ජීප් රථයට නංවාගෙන ඇත. පස්වරු 03.30 ට, 4.00 ට පමණ මිලේනියම් සිටි නිවාස සංකීර්ණයට ලඟා වී ඇත. එම නිවාස සංකීර්ණයේ කාර්යාලයට ගොස් ලොතරැයි වලින් ලද නිවෙස් දෙකක් ඇති බව පවසා ඒ පිළිබඳව විස්තර ලබාගෙන එම ස්ථානයේ සිටි අය විසින් නිවසක් ළඟට රැගෙන ගොස් පෙන්වා ඇත. එම ස්ථානයේ සිටි කොට කලිසමක් ඇඳ සිටි පුද්ගලයෙකුගෙන් විමසීමේදී එම නිවස කපිතාන් නිලාම්ගේ බිරිඳට අයත් නිවස බවට හඳුන්වා දී ඇත. එම පුද්ගලයා මාණ්ඩලික සැරයන් ඉලන්දාරිගේ ජයමාන්න ලෙස හඳුනාගෙන ඇත. ඉන්පසු එම නිවස අවට තම නිලධාරීන් පිරිසක් ආරක්ෂාවට යොදවා උප පොලිස් පරීක්ෂක ධර්මරත්න සමග නිවස පරීක්ෂා කර ඇත. නිවස තුලට යන විට අයි. සුභාෂ්කරන් නමැති LTTE සංවිධානයෙන් හාර වූ පුද්ගලයෙකුද සිට ඇත. නිවස තුළ වූ එක් කාමරයක් වසා තිබී ඇති අතර එය පරීක්ෂා කිරීමට අවශ්‍ය බව පැවසූ විට එහි යතුර කපිතාන් නිලාම් ලඟ තිබෙන බව ජයමාන්න නමැති අය පවසා ඇත.

කෙසේවෙතත් සාලයේ වූ මේසයක් මත අවිධිමත් ලෙස තබා තිබූ ගොනු දෙකක් තිබී ඇති අතර ඒවා සාක්ෂිකරු භාරයට ගෙන ඇත.

පැය භාගයක් පමණ වේලාවක් සිටින විට කිහිප දෙනෙකු වෑන් රථයකින් පැමිණ ඇති අතර ඔවුන් අතර සිටි නිලාම් නමැති කපිතාන්වරයාට පවසා ඇත්තේ උඩතලවින්න සමූහ ඝාතනයේ සැකකරුවෙකු වන චානුක රත්වත්තේ මහතා සැඟවී සිටින බවට ලද තොරතුරක් මත පැමිණි බවයි. ඒ අනුව වසා ඇති කාමරය විවෘත කරන ලෙසට පවසා ඇති අතර එය විවෘත කිරීමේදී අනාරක්ෂිත ලෙස එක පිට එක තබන ලද බිම් බෝම්බ, පැති බෝම්බ සහ T56 අවි නිරීක්ෂණය කර ඇත. ඊට අමතරව ඉතාමත්ම භයානක අවියක් වන තර්මෝබැරික් එසේ නොවේනම්, තාප අවි දෙකක් තිබුණු බව සාක්ෂිකරු පවසයි. මේවා ඉතා භයානක ප්‍රතිඵල ගෙන දෙන, එසේම වේදනාකාරී මරණ ඇති කරන අවි බවද සාක්ෂිකරු පවසන ලදී. ඊට අමතරව සයිනයිඩ් කරලක්ද තිබී ඇති අතර මෙම අවිආයුධ තැබීම සඳහා කිසිදු ආරක්ෂිත ක්‍රමවේදයක් හෝ නොතිබුණු බවද සාක්ෂිකරු පවසන ලදී. එසේම මෙම අවි ආයුධ සඳහා ආරක්ෂාවට කිසිවෙකු යොදවා නොතිබුණු බවද පවසන ලදී. එසේම ගිනි නිවන උපකරණ හෝ නොතිබුණු බව පවසයි. මේ පිළිබඳව ප්‍රශ්න කිරීමේදී කපිතාන් නිලාම් පවසා ඇත්තේ මෙහෙයුම් රාජකාරීවලට ගෙනෙන ලද අවි බවයි. ඒ සඳහා මෙම අවි රඳවා තබා ගැනීම සඳහා අවසර පත්‍රයක් ඉල්ලා සිටියද එවැනි අවසර පත්‍රයක් නොතිබුණු බවද, එම අවි ආයුධ සටහන් කිරීමට අදාල කිසිදු ලේඛනයක් හෝ නොතිබුණු බවද පවසන ලදී.

ඒ අනුව සාක්ෂිකරු විසින් අතුරුගිරිය පොලිස් ස්ථානාධිපතිවරයා කැඳවා මෙම ස්ථානය පිළිබඳව විමසීමේදී ඔහුට හෝ මේ පිළිබඳව දැනුමක් නොමැති

බවට වාර්තා කර ඇත. ඒ අනුව අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 109 වන වගන්තිය අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත. විශේෂයෙන්ම සාක්ෂිකරු පවසා සිටියේ තමා මෙම ස්ථානයට ගියේ චානුක රත්වත්තේ නමැති අය සොයා බැලීමට වුවද, එම ස්ථානයේ තිබූ අවි ආයුධ සළකා බලන විට මෙම ස්ථානය අපරාධයක් සඳහා යොදාගෙන තිබේද හා ඒ සම්බන්ධයෙන් සාධාරණ විමර්ශනයක් කළයුතු බවට තීරණය කල බවයි.

මීට පෙර අවස්ථාවක මහනුවර පන්විල පොලිස් වසමේ එක්තරා ස්ථානයක දේශපාලන නායකයෙක් ඝාතනය කිරීමේ චේතනාවෙන් පැති බෝම්බ දෙකක් සවි කර තිබූ බව දැනගෙන සිටි බවද පවසන ලදී. ඉන් පසු මෙම ස්ථානයේ තිබූ සියළුම භාණ්ඩ ලැයිස්තුගත කර ස්ථානාධිපති, අතුරුගිරිය ලවා ගෙන්වා ගත් වාහනයකින් සියළුම අවි සහ එම ස්ථානයේ සිටි හමුදා නිලධාරියා සහ සිවිල් පුද්ගලයාද රැගෙන නාරාහේන්පිට යුධ හමුදා පොලිස් කඳවුරට ගොස් ඇත. එම ස්ථානයට ගිය අවස්ථාවේදී යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක ජනරාල් බ්‍රිගේඩියර් හෙන්දාවිතාරණ පැමිණ මෙම නිලධාරීන් බුද්ධි අංශ නිලධාරීන් බවත්, ගිනිඅවි ඔවුන්ට භාර ගිනිඅවි බවත් පවසා ඇත. එම අවස්ථාවේදී බ්‍රිගේඩියර් හෙන්දාවිතාරණ යුධ හමුදාපතිවරයාට කතා කර ඇති අතර ඔහු විසින් එවකට පොලිස්පති වශයෙන් කටයුතු කල ලකී කොඩිතුවක්ක මහතාටද මේ බව පවසා ඇත. ඒ අනුව සාක්ෂිකරු පොලිස්පතිවරයාට පැහැදිලි කර දුන් පසු සියළුම කටයුතු අධිකරණය හරහා කරන ලෙසත්, මුදා නොහරින ලෙසටත් දැනුම් දී ඇත.

ඉන් පසු එම ස්ථානයට විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරී නිමල් ගුණතිලක, කොළඹ මධ්‍යම කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ලයනල් ගුණතිලක, විශ්‍රාම ලත් නියෝජ්‍ය පොලිස්පති රත්නායක යන අයවළුන් පැමිණ ඇත. එම නිලධාරීන් සහ බ්‍රිගේඩියර් හෙන්දාවිතාරණ අතර සාකච්ඡාවක් තිබී ඇති අතර ගිනිඅවි සහ එම පුද්ගලයන් කුරුඳුවත්ත පොලීසියට රැගෙන ගොස් ඇත. කුරුඳුවත්ත පොලීසියේදී විශේෂ කාර්ය බලකායේ සහකාර පොලිස් අධිකාරී එඩාමා විසින් ගිනිඅවි ක්‍රියාකාරීත්වය පරීක්ෂා කර නිශ්ක්‍රීය කළයුතු අවි නිශ්ක්‍රීය කර විශේෂ කාර්ය බලකාය විසින් එකී අවිආයුධ මහනුවර පිහිටි නිල සුනඛ අංශය වෙත ප්‍රවාහනය කර දී ඇත. ඒ සඳහා බලය විශේෂ කාර්ය බලකායේ නියෝජ්‍ය පොලිස්පති නිමල් ගුණතිලක මහතා විසින් සිදු කර ඇති අතර ගිනිඅවි ප්‍රවාහනය කිරීමද විශේෂ කාර්ය බලකායේ වාහන මගින් සිදු කර ඇත. ඒ අනුව එකී ගිනිඅවි මහනුවර පිහිටි නිල සුනඛ අංශය වෙතට රැගෙන ගොස් ඇත. එම භාණ්ඩ භාර ගැනීම සහ සටහන් යෙදීම උප පොලිස් පරීක්ෂක ධර්මරත්න විසින් සිදු කර ඇත. ඉන් පසු එම ස්ථානය නිරීක්ෂණය කරන ලද මහනුවර මහේස්ත්‍රාත්වරයා විසින් එකී අවි විශේෂ කාර්ය බලකායේ ගෝණගේන කඳවුරේ තැන්පත් කරන ලෙසට නියෝග කර ඇත. අවි ආයුධ සඳහන් ලේඛනය වි. 04 ලෙස ලකුණු කරන ලදී. අත්අඩංගුවට ගත් සැකකරුවන් මහනුවර පොලිස් ස්ථානයේ රඳවා ඇත. ඒ සඳහා ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ රඳවා ගැනීමේ නියෝගයක් මහනුවර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා විසින් නිකුත් කර ඇත. එම රඳවා ගැනීමේ නියෝගය වි. 05 ලෙස ලකුණු කරන ලදී. වි. 05 සහ

වි. 06 ලෙස ලකුණු කරන ලද ලේඛන ධර්මරත්න නිලධාරියා විසින් පිළියෙල කර ඇති අතර චූදිත එම ලේඛන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වෙත ඉදිරිපත් කර ඇත. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අශෝක රත්නවීර විසින් නිකුත් කර ඇති ලේඛනය වි.07 ලෙසත්, එහි අත්සන සහිත කාබන් පිටපත වි. 07(A) ලෙසත් ලකුණු කරන ලදී. ඒ අනුව 2002.01.02 සිට 05 වන දින දක්වා රැඳවුම් නියෝගයක් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අශෝක රත්නවීර විසින් සිදු කර ඇත. මහනුවර පොලිස් ස්ථානයේ මෙම පිරිස රඳවා ගැනීමට ඉඩකඩ මදි වූ හෙයින් කටුගස්තොට පොලීසියේ රඳවා ගැනීමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීට කරන ලද නියෝගයක් අනුව මෙම පිරිස කටුගස්තොට පොලිස් ස්ථානයේ රැඳවීමට පියවර ගෙන ඇත.

අතුරුගිරියේ සිට රැගෙන එන ලද නිලධාරීන් සහ සිවිල් පුද්ගලයා රඳවා ගැනීමට අදාල ලේඛන පිළිවෙලින් වි. 07 සිට වි. 10 දක්වා ලකුණු කරන ලදී. නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කරන ලද ලිපිය වි. 11 වශයෙන් ලකුණු කරන ලදී.

නියෝජ්‍ය පොලිස්පති මහින්ද බාලසූරිය විසින් මීට අදාල විමර්ශනය සිදු කල යුතු ආකාරය සම්බන්ධයෙන් උපදෙස් සහිත ලිපියක් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වෙත යොමු කර ඇති අතර එය වි. 12 ලෙස ලකුණු කරන ලදී.

කෙසේවෙතත් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් රැඳවුම් නියෝග ලබාදීම ප්‍රතික්ෂේප කර ඇත. (සිවිල් පුද්ගලයාට හැර)

එහි ප්‍රතිඵලයක් වශයෙන් රඳවා සිටි පුද්ගලයන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ උපදෙස් මත මහුනුවර යටිනුවර වීදියේ සිංහ රෙජිමේන්තුවට භාර දී ඇත.

ඉන් පසු උප පොලිස් පරීක්ෂක ධර්මරත්න විසින් අත්අඩංගුවට ගත් පුද්ගලයන් හය දෙනා ඇතුළු අට දෙනෙකුට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ 278 සහ 279 වගන්ති යටතේ නඩු පැවරීමට පියවර ගත් බවද, පසුව නීතිපතිවරයා විසින් එම නඩුව ඉදිරියට පවත්වාගෙන නොයන බවට මහේස්ත්‍රාත්වරයා වෙත දැනුම් දුන් බවද පවසන ලදී.

වැඩිදුරටත් සාක්ෂිකරු පවසා සිටයේ පැමිණිල්ලෙන් පැ. 09 ලෙස ලකුණු කරන ලද ලිපිය කිසිදු අවස්ථාවක තමා අතට පත් නොවූ බවයි. එසේම කපිතාන් සමන් කුමාර හෝ මේජර් සලේ තමා මුණ නොගැසුණු බවද පවසන ලදී.

එසේම පැ. 09 දරණ ලේඛනය භාර ගත් බවට තමාගේ අත්සනක් හෝ ඉදිරිපත්ව නොමැති බව පවසන ලදී.

වැඩිදුරටත් සාක්ෂිකරු පැ. 01 සහ Y.01 දරණ ලේඛන අනුසාරයෙන් පවසා සිටියේ ඒවායේ අන්තර්ගතයන් විධිමත්ව නොමැති බවයි.

විත්තිය වෙනුවෙන් සාක්ෂි දුන් කර්නල් පරාක්‍රම දිසානායක වර්ෂ 1988 සිට 2000 දක්වා යුද හමුදා බුද්ධි අශයේ සේවය කර ඇත. ඔහු ගමන් නියෝගයක අන්තර්ගත විය යුතු කරුණු සම්බන්ධයෙන් සහ ගමන් නියෝගයක් යොදන ආකාරය සම්බන්ධයෙන් සාක්ෂි දෙන ලදී. ක්‍රියාන්විත රාජකාරියක් සඳහා පිටව යන විට අවි ආයුධ නිකුත් කිරීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය පිළිබඳව සාක්ෂි දෙන ලදී. Y.01 සහ Y.02 දරණ ලේඛන අනුව සාමාන්‍ය ක්‍රියාපටිපාටිය තුළ ඉහළ නිලධාරියෙකු ඒවා අත්සන් කළයුතු බව පවසන ලදී. පැමිණිල්ලෙන් හරස් ප්‍රශ්න අසමින් සාක්ෂිකරු යුධ හමුදාවේ රාජකාරී කරන කාලය තුළ සිදු වූ යම් යම් අක්‍රමිකතා කීපයක් සම්බන්ධයෙන් ප්‍රශ්න කරන ලදී.

විත්තිය වෙනුවෙන් සාක්ෂි දුන් දිහාන් ප්‍රදීප් ශ්‍රී ලංකා යුධ හමුදාවේ නීති නිලධාරියෙකි. Y.01, Y.01(1), (2), (3), (4), (5), (6), Y.02, Y.02(1), (2), (3), (4), (5), (6), (7), (8) දරණ ලේඛන මුල් ලේඛන අනුසාරයෙන් ඉදිරිපත් කර ඇති පිටපත් බව පිළිගන්නා ලදී. වි. 14 දරණ චක්‍රලේඛනයද සත්‍ය පිටපතක් බවට පිළිගන්නා ලදී.

විත්තිය වෙනුවෙන් සාක්ෂි දුන් කුඩා බණ්ඩාර හේරත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත පොලිස් පරීක්ෂකවරයෙකි. 2002.01.10 වන දින මහනුවර අපරාධ සහ මෙහෙයුම් අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ධර්මරත්න මහනුවර මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක 12056/2022 දරණ නියෝගය යටතේ විශේෂ කාර්ය බලකාය ගෝණගේන කඳවුරේ අවි ගබඩාවේ,

2002.01.10 වන දින තැන්පත් කිරීමට භාර දුන් ලේඛන ලැයිස්තුව පි. 38 වශයෙන් විශේෂ කාර්ය බලකායේ තොරතුරු පොත්වල ඇතුලත් කර ඇති බව පිළිගන්නා ලදී.

විත්තිය වෙනුවෙන් සාක්ෂි දුන් සහකාර පොලිස් අධිකාරී චානක ද සිල්වා 2002.01.10 වන දින උප පොලිස් පරීක්ෂක ධර්මරත්න විසින් අත්සන් කර තිබෙන වි. 04 දරණ ලේඛනය හඳුනා ගන්නා ලදී. එසේම වි. 05, වි.06, වි.07, වි.08, වි.09, වි.10, වි.11, වි.12 දරණ ලේඛන සාක්ෂිකරු විසින් භාරගත් බව පිළිගන්නා ලදී. එසේම වි.14, X.01, X.02 දරණ ලේඛණ ඒ ආකාරයෙන් පවතින බව පිළිගන්නා ලදී. X.03 දරණ ලේඛනයද ඒ ආකාරයෙන්ම පවතින බවත් පිළිගන්නා ලදී.

<u>සාක්ෂි විශ්ලේෂණය</u>

ඉදිරිපත් වී ඇති සාක්ෂි සමස්ථයක් ලෙස සළකා බැලීමේදී පහත සඳහන් කරුණු හබයකට ලක් නොවූ කරුණු ලෙස තීරණය කළහැකිය.

01. 2001.12.05 වන දින මහනුවර දිස්ත්‍රික්කයේ වත්තේගම පොලිස් වසමේ උඩතලවින්නේදී මුස්ලිම් ජාතිකයන් දස දෙනෙකු වෙඩි තබා ඝාතනය කිරීම සහ සිවු දෙනෙකු වෙඩි වැදීමෙන් බරපතල තුවාල ලැබීම.

02. එම සිද්ධියට අදාලව එවකට ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් සිටි අනුරුද්ධ රත්වත්තේ ඇතුළු හමුදා නිලධාරීන් පිරිසකට ශ්‍රී ලංකා ජනරජයේ නීතිපතිවරයා විසින් නඩු පවරා තිබීම.

03. මේ පිළිබඳ විමර්ශන කටයුතු චූදිත විසින් සිදු කර තිබීම සහ චූදිත විසින් යුධ හමුදා නිලධාරීන් කීප දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබීම.

04. 2001.12.31 වන දින අපරාධ හා මෙහෙයුම් අංශයේ ස්ථානාධිපතිවරයා විසින් ගොනු කර ඇති NSB/684/2001 දරණ වැඩිදුර වාර්තාව අනුව මෙම සිදුවීමට අදාල බොහොමයක් නිලධාරීන් යුධ හමුදාවට අදාල නිලධාරීන් වන හෙයින් විමර්ශන කටයුතු වලට යුධ හමුදාවෙන් නිසි සහාය නොලැබෙන බව පවසා මෙම විමර්ශනයට සහාය දෙන ලෙස යුධ හමුදා පොලීසියේ මේජර් ක්ලිෆර්ඩ් ද සොයිසාට නියෝග කරන ලෙස මහේස්ත්‍රාත්වරයාගෙන් ඉල්ලා සිටීම සහ මහේස්ත්‍රාත්වරයා එකී ඉල්ලීමට ඉඩ දී තිබීම. (පැ. 17)

05. 2002.01.02 වන දින චූදිත විසින් අතුරුගිරිය මිලේනියම් සිටි නිවාස සංකීර්ණයේ පවත්වාගෙන ගියේ යැයි කියනු ලබන යුධ හමුදා බුද්ධි අංශ ආරක්ෂක නිවස්නය පරීක්ෂා කර බැලීම.

06. එම පරීක්ෂා කිරීමේ කටයුතු සඳහා යුධ හමුදා පොලීසියේ මේජර් ක්ලිෆර්ඩ් ද සොයිසා සහභාගී වීම.

07. එම ස්ථානයේ කාමරයක තිබී පැමිණිල්ලෙන් පෙන්වා සිටි අවි ආයුධ වූදිත අත්අඩංගුවට ගෙන නාරාහේන්පිට පිහිටි යුධ හමුදා මූලස්ථානයට රැගෙන යාම.

08. එසේම එම ස්ථානයේ සිටි කපිතාන් මොහොමඩ් නිලාම්, මාණ්ඩලික සැරයන් උදලාගම, මාණ්ඩලික සැරයන් ජයමාන්න, ලාන්ස් කෝප්රල් හිල්මි, කෝප්රල් නිශ්ශංක හේරත් සහ සුභාෂ්කරන් නමැති අයවළුන් අත්අඩංගුවට ගෙන රැගෙන යාම.

09. නාරාහේන්පිට යුධ හමුදා පොලීසියේ සිට අවි ආයුධ සහ ඉහත නම් සඳහන් හමුදා නිලධාරීන් සහ සුභාෂ්කරන් නමැති අය කුරුඳුවත්ත පොලීසියට රැගෙන ගොස් එම ස්ථානයේ සිට මහනුවර නිල සුනඛ අංශය වෙත රැගෙන යාම.

10. ඉහත යුධ හමුදා නිලධාරීන් සහ සුභාෂ්කරන් නමැති අය මහනුවර පොලිස් ස්ථානයේ සහ කටුගස්තොට පොලිස් ස්ථානයේ රඳවා තැබීම.

11. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව දින 90 ක කාලයක් රඳවා තබාගෙන ප්‍රශ්න කිරීමට කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබීම.

12. එකී ප්‍රතික්ෂේප කිරීම මත සුභාෂ්කරන් නමැති අය හැර සෙසු හමුදා නිලධාරීන් නැවත යුධ හමුදාවට භාර දීම.

13. ඉහත යුධ හමුදා නිලධාරීන් සහ සුභාෂ්කරන් නමැති අයටද, යුධ හමුදා බුද්ධි අංශයේ අධ්‍යක්ෂක බ්‍රිගේඩියර් කපිල හෙන්දාවිතාරණද, එවකට යුධ

හමුදාපතිව සිටි මේජර් ජනරල් ලයනල් බලගල්ලට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ 277, 279 යටතේ නඩු පවරා තිබීම. (ඉහත 01 සිට 06 දක්වා චූදිතයන්ට එම වගන්තිය යටතේද, 07 සහ 08 චූදිතයින්ට ආධාර හා අනුබල දීම සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 සහ 102 වගන්ති යටතේද)

ඉහත සඳහන් පිළිගැනීම් හැර ඉදිරිපත් වී ඇති සාක්ෂි සමස්ථයක් ලෙස සළකා බැලීමේදී ඉහත නම් සඳහන් යුධ හමුදා නිලධාරීන් සහ සුභාෂ්කරන් නමැති අය මහනුවර පොලීසියේ සහ කටුගස්තොට පොලීසියේ රඳවා තබා ඇත්තේ එවකට මහනුවර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වශයෙන් කටයුතු කරන ලද අශෝක රත්නවීර නමැති අය විසින් නිකුත් කර ඇති රඳවා ගැනීමේ නියෝග මත බව පැහැදිලිව පෙනී යයි. එකී රඳවා ගැනීමේ නියෝගය ලබා ගැනීම සඳහා විධිමත් ඉල්ලීමක් මහනුවර අපරාධ හා මෙහෙයුම් අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ධර්මරත්න ලිඛිතව මෙම නඩුවේ චූදිත මාර්ගයෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අශෝක රත්නවීර වෙත ඉදිරිපත් කර ඇත. මේ බව වි. 05 සිට වි. 07A දක්වා ලේඛන මගින් පැහැදිලි වේ.

චූදිත මහනුවර පිහිටි නිල සුනඛ අංශය භාර පොලිස් අධිකාරීවරයා වශයෙන් කටයුතු කර ඇත. විශේෂයෙන්ම උඩතලවින්න දස පුද්ගල ඝාතනයෙන් පසු මෙම කටයුතු විමර්ශනය කිරීම සඳහා පොලිස්පතිවරයා විසින් චූදිත පත් කර ඇත. පැමිණිල්ලෙන් පැ. 17 ලෙස ලකුණු කරන ලද NSB/684/2001 දරණ

නඩුවට ඉදිරිපත් කර ඇති අතුරු වාර්තාව ප්‍රකාරව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 125 වන වගන්තිය යටතේ උඩතලවින්න ඝාතනය පිළිබඳ විමර්ශන කටයුතු කරගෙන යන බවට වාර්තා කර ඇත.

පැමිණිල්ලෙන්ම පැ. 17 ලෙස මෙම ලේඛනය ලකුණු කර තිබුණද චූදිත සාක්ෂි දෙන අවස්ථාවේදී මෙම විමර්ශනය සඳහා චූදිත පත් කල බවට වූ විදුලි පණිවිඩය ඔප්පු කිරීමේ භාරයට යටත්ව ලකුණු කරන ලෙසට ඉල්ලා සිටියද පැමිණිල්ලෙන්ම පැ. 17 ලෙස ලකුණු කරන ලද වැඩිදුර වාර්තාව අනුව කිසිදු අවස්ථාවක මෙම පැ. 17 දරණ ලේඛනය ව්‍යාජ ලේඛනයක් හෝ අසත්‍ය ලේඛනයක් බවට පැමිණිල්ල පවසා නොසිටින ලදී.

මේ අනුව පොලිස්පතිවරයා විසින් උඩතලවින්න දස පුද්ගල මිනිස් ඝාතනයට අදාල විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා චූදිත පත් කලේය යන කරුණ තහවුරු වී ඇති බවට මම තීරණය කරමි.

ඒ අනුව චූදිත 2002.01.02 වන දින අතුරුගිරිය ආරක්ෂක නිවස්නය පරීක්ෂා කිරීමට පෙර එවකට ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් සිටි අනුරුද්ධ රත්වත්තේ මහතාගේ නිවස පරීක්ෂා කිරීම, මහනුවර යටිනුවර වීදියේ සිංහ රෙජිමේන්තු කඳවුර පරීක්ෂා කිරීම, කුරුණෑගල බෝයගනේ යුධ හමුදා කඳවුර පරීක්ෂා කිරීම යන කරුණු කිසිදු ආකාරයකට හබයට ලක් වූ කරුණු නොවේ.

මා ඉහතින් සඳහන් කරන ලද කරුණු සියල්ලම සළකා බැලීමේදී චූදිත විසින් අනුරුද්ධ රත්වත්තේ ඇමතිවරයාගේ පුත්‍රයෙකු වන චානුක රත්වත්තේ නමැති අය සැඟවී සිටින ස්ථානය සොයා මෙහෙයුම් කිරීම නීතියට පටහැනි නොවේ. විශේෂයෙන්ම චූදිතට ලද තොරතුරක් අනුව අතුරුගිරිය මිලේනියම් සිටි නිවාස සංකීර්ණයේ මුස්ලිම් යුධ හමුදා නිලධරයෙකුගේ නිවසේ ඔහු රැදී සිටින බවට ලද තොරතුර පරික්ෂා කිරීම සඳහා යුධ හමුදාවේ සහාය ලබාගෙන ඇති බව පැමිණිල්ල වෙනුවෙන්ම සාක්ෂියට කැඳවන ලද බ්‍රිගේඩියර් ධර්මරත්න එනම් පැ.සා. 11, මේජර් පොඩිරාලහාමි එනම් පැ.සා. 12 සහ මේජර් ක්ලිෆර්ඩ් ද සොයිසා එනම් පැ.සා. 10 ගේ සාක්ෂි වලින් තහවුරු වේ. පැමිණිල්ලෙන්ම සාක්ෂියට කැඳවන ලද ඉහත සාක්ෂිකරුවන්ගේ සාක්ෂි වලින් තහවුරු වූ ආකාරයට උඩතලවින්න දස පුද්ගල ඝාතන නඩුවේ යම්කිසි සැකකරුවෙකු සැඟවී සිටින්නේ යැයි කියනු ලබන ස්ථානයක් පරීක්ෂා කිරීමට නීත්‍යානුකූල බලය චූදිත සතු වේ. එසේම එවැනි පුද්ගලයෙකුට සැඟවී සිටීමට අධාර හා අනුබල දෙන පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමටද චූදිතට නීත්‍යානුකූල බලයක් ඇත.

පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි විශේෂයෙන්ම පැමිණිල්ලේ සාක්ෂි අංක 02 ගේ සාක්ෂිය වැදගත් සාක්ෂියක් වන අතර අතුරුගිරිය මිලේනියම් සිටි හි තිබූ යුධ හමුදා බුද්ධි අංශයේ ආරක්ෂිත නිවස්නය රහසිගත ස්ථානයක් වේ. එය කිසිදු ස්ථානයක යුධ හමුදාව හෝ වෙනත් ආරක්ෂක අංශයකට අයත් ස්ථානයක් බවට සඳහන් කරන ස්ථානයක් නොවේ. චූදිත 2002.01.02 එම ස්ථානයට යන

විට එය හුදු නිවාසයක් වශයෙන් තිබී ඇති අතර එහි සිටි ජයමාන්න නමැති යුධ හමුදා බුද්ධි අංශ නිලධාරියාට දැනුම් දී මෙම ස්ථානය පරීක්ෂා කර ඇත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 06 මේජර් ජනරාල් හෙන්දාවිතාරණට අනුවද මෙම ස්ථානය පිළිබඳව දැනගෙන සිට ඇත්තේ සාක්ෂිකරු, පැමිණිල්ලේ සාක්ෂි අංක 08 සහ යුධ හමුදාපතිවරයා පමණි. මේජර් ක්ලිෆර්ඩ් ද සොයිසාගේ සාක්ෂිය අනුවද මෙම ස්ථානය චූදිත විසින් සොයාගෙන ඇත්තේ නිවාස සංකීර්ණයේ කාර්යාලයෙනි. මේ අනුව චූදිත මෙම ස්ථානයට පිටව යන විට ස්ථානය යුධ හමුදා ආරක්ෂිත නිවස්නයක් බවට පූර්ව දැනුමක් තිබී නොමැති බව පැහැදිලි වේ.

ඒ අනුව උඩතලවින්න සමූහ මිනිස් ඝාතනය සිදුවීම විමර්ශනය කරනු ලබන පොලිස් අධිකාරීවරයෙකු වශයෙන් තමාට ලද තොරතුරක් පරීක්ෂා කිරීම සඳහා බලතල තිබුණද, මෙම ස්ථානය යුධ හමුදා නිලධරයෙකු සතු ස්ථානයක් වන හෙයින් ඔහු යුධ හමුදා පොලීසියේ සහාය ලබාගෙන මෙම විමර්ශන කටයුත්තට සහභාගී වී ඇත. එපමණක් නොව පැමිණිල්ලෙන් පැ. 17 ලෙස ලකුණු කරන ලද ලේඛනය ප්‍රකාරවම මෙම විමර්ශන කටයුත්තට යුධ හමුදාවේ නිසි සහායක් නොලැබනෙ බව පවසා යුධ හමුදා පොලිස් නිලධරයෙකුගේ සහාය ලබා ගැනීමට අධිකරණ නියෝගයක්ද ලබාගෙන ඇත. මේ අනුව මිලේනියම් සිටි නිවාස සංකීර්ණයේ පිහිටි ආරක්ෂිත නිවස්නය වෙත ඇතුළු වීම දක්වා වූ කාර්ය පටිපාටිය චූදිත විසින් නිසි නීත්‍යානුකූල ක්‍රමවේදයක් ඔස්සේ සිදු කර ඇති බව

ඉතා පැහැදිලිව පෙනී යන අතර ඔහු එහිදී තම නිල බලය අයුතු ලෙස භාවිතා කිරීමක් සිදු කර ඇති බවට සැළකීමට හෝ හැකියාවක් නැත.

එම නිවස පරීක්ෂා කිරීමේදී කාමරයක් තුළ විවිධ ගිනිඅවි සහ ආයුධ තිබී ඇත. එහිදී මෙම ස්ථානය පැවති ආකාරය අනුව එය හුදෙක් නිවාස සංකීර්ණයක පිහිටි එක් නිවාස ස්ථානයකි. ඒ තුළ ක්ලේමෝ බෝම්බ, තර්මෝබැරික් බෝම්බ, සයනයිඩ් කරල්, ගිනිඅවි සහ LTTE ඇඳුම් සැළකිය යුතු ප්‍රමායක් තිබෙන අවස්ථාවක සාම නිලධරයෙකු වශයෙන් පොලිස් නිලධරයෙකුට ඒ පිළිබඳව විමර්ශනය කිරීමට අනිවාර්යෙන්ම බලයක් තිබිය යුතුය. විශේෂයෙන්ම මෙය සළකා බැලිය යුතු වන්නේ චූදිත විමර්ශනය කරනු ලැබූ උඩතලවින්න දස පුද්ගල ඝාතන සිද්ධියට අදාලව ඒ වන විටත් යුධ හමුදා නිලධාරීන් කීප දෙනෙකු සහ එවකට ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා සහ ඔහුගේ පුතුන් දෙදෙනෙකුද ඊට සම්බන්ධ බවට ලද තොරතුරු මත වේ.

පැමිණිල්ලෙන් පැ. 18 ලෙස ලකුණු කර ඇත්තේ මහනුවර මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී 12056 දරණ නඩුව වේ. එහි පැමිණිල්ල පැ. 18(1) වශයෙන්ද, 2022.01.07 දිනැති මුල් තොරතුරු වාර්තාව පැ. 18(3) වශයෙන්ද, ඉහතින් විස්තර කරන ලද සැකකරුවන් රඳවා ගැනීමට අවසරය ඉල්ලා ස්ථානාධිපති අපරාධ හා මෙහෙයුම් විසින් ලකුණු කර ඇති වාර්තාව පැ. 18(2) වශයෙන්ද, 2003.01.24 දිනැතිව එකී චූදිතයන් නිදහස් කරන ලෙසට නීතිපතිවරයා වෙනුවෙන් යවන ලද ලිපිය පැ. 18(4) වශයෙන්ද ලකුණු කර ඇත.

පැමිණිල්ලෙන් පැ. 17 ලෙස ලකුණු කර ඇති එන්.එස්.බී 684/2001 තොරතුරු වාර්තාව අනුව 2001.12.31 වන දින ස්ථානාධිපති අපරාධ හා මෙහෙයුම් අංශය පන්විල මහේස්ත්‍රාත්වරයා වෙත වාර්තා කර ඇත්තේ උඩතලවින්න ඝාතනයට අදාලව විමර්ශනය පවත්වාගෙන යාමේදී විමර්ශන කටයුතු කරගෙන යාමට සිදුව ඇත්තේ ශ්‍රී ලංකා යුධ හමුදාව මුල් කරගෙන බවයි. එම වාර්තාවේ සඳහන් පහත ඡේදය කෙරෙහි අධිකරණයේ අවධානය යොමු කරන ලදී. එය මෙසේය.

> **"..........තවද මෙම සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනය පවත්වාගෙන යාමේදී බොහොමයක් විමර්ශන කරගෙන යාමට සිදුව ඇත්තේ ශ්‍රී ලංකා යුධ හමුදාව මුල් කරගෙනය. මෙහිදී මෙම විමර්ශනයට යුධ හමුදා පොලීසියේ සහාය නිසි ලෙස අප විමර්ශන කණ්ඩයාමට නොලැබෙන බැවින් විමර්ශන අවසන් කිරීමේ අපහසුතාවයක් ගොඩනැගී ඇත. එබැවින් මෙම විමර්ශන කටයුතු ඉක්මන් කිරීම සඳහා යුධ හමුදා පොලීසියේ විශේෂ විමර්ශන අංශයේ මේජර් ක්ලිෆර්ඩ් සොයිසා යන නිලධාරියා මහනුවර අපරාධ සහ මෙහෙයුම් අංශයේ පොලිස් අධිකාරී කේ. උඩුගම්පල මහතාගේ පරීක්ෂණ කණ්ඩායමට අනුයුක්ත කිරීමට යුධ හමුදාපතිවරයාට නියෝගයක් ලබා දෙන ලෙසත් ඉල්ලා සිටිමි."**

මෙම නඩුවේ චූදිත අතුරුගිරිය නිවාසය පරීක්ෂා කිරීමට පිටව ගොස් ඇත්තේ මහනුවර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාට දැනුම් දී ඔහුගේ නියෝග මත වෙනත් පොලීසියකින් ලබා ගත් වාහනයකින් බවටද පවසන ලදී. මේ සම්බන්ධයෙන් චූදිත උසස් නිලධාරීන්ගේ ගමන් සටහන් පොතේ සටහන් යොදා ඇති අතර එය වි.16 ලෙස ලකුණු කරන ලදී.

මෙම කරුණ චූදිත හරස් ප්‍රශ්න වලට භාජනය කිරීමේදී පැමිණිල්ල විසින් හරස් ප්‍රශ්න වලට ලක් කර නැත.

එබැවින් මෙම කරුණ පැමිණිල්ල විසින් පිළිගත් කරුණක් ලෙස සැළකීමට සිදු වේ. මක්නිසාදයත් චූදිත අතුරුගිරිය මිලේනියම් සිටි නිවාස සංකීර්ණය පරීක්ෂා කිරීමට පිටව ගියේ උඩතලවින්න ඝාතනයට අදාල විමර්ශන කටයුත්තක් සඳහාය යන කරුණ මෙම නඩුවේ ඉතා වැදගත් කරුණක් වන අතර එසේ පිටව ගොස් ඇත්තේ උසස් පොලිස් නිලධාරීන්ට දැනුම් දීමෙන් බව පවසන කරුණ පැමිණිල්ල හබයට ලක් නොකිරීමෙන් පෙනී යන්නේ එය පැමිණිල්ලද පිළිගත් කරුණක් බවයි. මේ සම්බන්ධයෙන් අධිකරණය **දැඩිමුණි ඉන්ද්‍රසේන සහ දැඩිමුණි විමලසේන එදිරිව නීතිපති (2008)** සඳහන් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පංච පුද්ගල විනිසුරු මඩුල්ලක තීරණය ප්‍රකාශයට පත් කරන ලද **SCTAB Appeal 02/2012 කුමාරසිරි සහ තවත් අය එදිරිව නීතිපති නඩුවේ ශිරානි තිලකවර්ධන විනිසුරුතුමිය** සාකච්ඡා කර ඇත.

මෙම කරුණ සළකා බලන විට පැහැදිලිව පෙනී යන්නේ චූදිත මෙම විමර්ශනය සඳහා මහනුවරින් පිටව යන්නේ නීත්‍යානුකූලව ඉහළ නිලධාරීන්ට දැනුම් දී නිසි අනුමැතියකින් බවයි.

එපමණක් නොව චූදිත අතුරුගිරිය නිවාස සංකීර්ණයට ගොස් ඇත්තේ නාරාහේන්පිට යුධ හමුදා පොලීසියට ගොස් එහි ඉහළ නිලධාරීන් දැනුවත් කර මේජර් ක්ලිෆඩ් ද සොයිසා සමග වේ. පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂියට කැඳවන ලද සාක්ෂි අංක 11 බ්‍රිගේඩියර් ධර්මරත්න, සාක්ෂි අංක 12 මේජර් පොඩි රාළහාමි යන අයගේ සාක්ෂි වලින්ද මෙම තත්ත්වය තහවුරු වේ.

මෙම නඩුවේ ඉදරිපත් වී ඇති සාක්ෂි සියල්ල සළකා බැලීමේදී විශේෂයෙන්ම පැමිණිල්ලෙන් පැ. 01 සිට පැ. 18 දක්වා ලකුණු කරන ලද ලේඛන අනුවද යම් යම් ගිනිඅවි සහ විවිධ වර්ගයේ බෝම්බ මේජර් නිලාම්ට සහ යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක නමින් නිකුත් කර තිබුණද, මෙම කිසිදු අවියක් අතුරුගිරියේ නිවස්නයේ රඳවා තැබීමට අවසර ලබා දී ඇති බවට කිසිදු ලේඛනමය සාක්ෂියක් ඉදිරිපත්ව නැත.

පැමිණිල්ලෙන් පැ. 09 ලෙස ලකුණු කරන ලද ලේඛනය සළකා බැලුවද එහි සඳහන් කර ඇත්තේ එහි සඳහන් අවි ආයුධ මඩකලපුව ප්‍රදේශයේ මුදා නොගත් ප්‍රදේශවල පැවති යුධ හමුදා ක්‍රියාකාරීත්වයට භාවිතා කිරීම සඳහා ලබා දුන් ඒවා

මිස, ඒවා අතුරුගිරිය ආරක්ෂිත නිවස්නයේ තැන්පත් කර තැබීමට අවසර ලබාදී තිබූ බවක් නොවේ.

එවැනි තත්ත්වයක් තුළ යම්කිසි පෞද්ගලික නිවාසයක් තුළ යුධ හමුදා බුද්ධි අංශ නිලධාරීන් කීප දෙනෙකු රැඳී සිටීම සහ ඔවුන් භාරයේ ඉතා දරුණු ඝණයේ අවි ආයුධ තිබෙන අවස්ථාවක හුදෙක් යම් නිලධරයෙකු විසින් ඒවා නිත්‍යානුකූලව නිකුත් කර තිබුණේ යැයි පැවසීම ප්‍රමාණවත් නොවන අතර වගකිව යුතු පොලිස් නිලධරයෙකු වශයෙන් තමා කරනු ලබන විමර්ශනයේ බරපතල භාවය සමග සළකා බලන විට මිලේනියම් සිටි නිවාස සංකීරණයේ නිවසක තිබූ මෙම අවි ආයුධ සහ පුද්ගලයන් පිළිබඳව විමර්ශනය කිරීම ආරම්භ කිරීම හෝ ඔවුන් අත්අඩංගුවට ගැනීම නීති විරෝධී ක්‍රියාවක් ලෙස මෙම නඩුවේ ඉදරිපත් වී ඇති සාක්ෂි සළකා බැලීමේදී තීරණය කිරීමට හැකියාවක් නැත.

නමුත් පැමිණිල්ලෙන් පැ. 17 ලෙස ලකුණු කරන ලද ලේඛනයේ අන්තර්ගතය සළකා බලන විට සහ චූදිත මෙම අධිකරණයේ දිවුරුම්පිට දුන් සාක්ෂිය අනුව උඩතලවින්න ඝාතන නඩුවට යුධ හමුදාවේ නිසි සහාය නොලැබෙන්නේය යන කරුණ පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දුන් පැමිණිල්ලේ සාක්ෂි අංක 06 මේජර් ජනරාල් කපිල හෙන්දාවිතාරණ සහ සාක්ෂි අංක 08 මේජර් සුරේෂ් සලේ යන නිලධාරීන් සාක්ෂි දුන් විලාෂය අනුව තහවුරු වේ.

විශේෂයෙන්ම පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දුන් සාක්ෂි අංක 08 විත්තියේ හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් 2021.03.19 වන දින පෙ.ව. 10.25 සටහනේ 12 සහ 13 පිටුවල දී ඇති සාක්ෂි වලින් එය පැහැදිලි වේ. 12 වන පිටුවේ පහත ප්‍රශ්න වලට දී ඇති පිළතුරු වැදගත් වේ.

ප්‍ර :- මම තමුන්ට යෝජනා කරනවා ඒ අවස්ථාවේ 2001 ජනවාරි මාසයේදී මේ විත්තිකරු තමුන්ට මේ කාරණාව කිවුවයි කියලා. ඒ කියන්නේ ලොහාන් රත්වත්තේ, චානුක රත්වත්තේ ඔය ස්ථානයට ආවාද කියලා සැක සහිතයි. ආයුධ සැක සහිතයි. ඒ නිසා තවදුරටත් විමර්ශනය කරන්න ඕනේ කියලා මේ විත්තිකරු තමුන්ට කිව්වයි කියලා මම යෝජනා කරනවා?

උ :- ඔබේ යෝජනාව පිළිගගන්නවා. නමුත් මගේ මතකයේ හැටියට මම ප්‍රකාශය කලේ. ඒක මම ඒ අවස්ථාවේදී එහෙම එකක් ප්‍රකාශ කලේ නැහැ. ගරු ස්වාමීනි, මම හමුදා නිලධාරියෙක්. අපි මේකේ වෙන කොහොමද ඉවෙන්ට් ගැන අපි දන්නේ නැහැ. අප සම්පූර්ණයෙන්ම ෆෝකස් කරන්නේ මේ සිදුවීම, මේ සිදුවීමෙන් ඒ නිලධාරීන් බේරා ගැනීමට ඒ ජස්ටිෆිකේෂන් එක තමයි මම කරන්නේ. එහෙම නැතුව අනෙකුත් සිදුවීම් පිළිබඳව යුධ හමුදා නිලධාරියෙක් හැටියට, බුද්ධි නිලධාරියෙක් හැටියට අපිට අයිති වෙන්නේ නැහැ. මොකද අපේ ෆෝකස් එක ගොඩක් වෙනස්.

ප්‍ර :- මහත්මයා කරුණාකරලා කියන්න තමුන් කිවුවේ තමුන්ගේ ෆෝකස් එක වෙන්නේ මොනවද මේ සිදුවීමෙන් මේ නිලධාරීන් බේරා ගන්න එක?

උ :- එහෙමයි.

ප්‍ර :- එතකොට ඒ ඉලක්කය කරා යන එක තමයි තමුන්ගේ අරමුණ වුණේ නේද?

උ :- ඔව්.

ප්‍ර :- ඒතකොට ඒ ඉලක්කය කරා යන එක තමයි තමුන්ගේ අරමුණ නේද?

උ :- ඔබ නිවැරදියි.

අනෙක් අතට පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දුන් මේජර් ජනරාල් කපිල හෙන්දාවිතාරණ වූදිත මෙම නිවස්නය පරීක්ෂා කිරීම සඳහා යන ලද්දේ යුද හමුදා පොලීසියේ විනයාරක්ෂකට දැනුම් දී යුධ හමුදා පොලිස් නිලධාරියෙකු සමග බවට කළ යෝජනාව සම්බන්ධයෙන් ඔහුගේ පිළිතුර වූයේ මෙය කුමන්ත්‍රණයක් බවයි.

මෙය සත්‍යයක් නම් නීතිපතිවරයා විසින් මෙම නඩුව පැවරීමේදී එම කුමන්ත්‍රණයට සහභාගී වූයේ යැයි කියනු ලබන යුධ හමුදා නිලධාරීන්ට හෝ වෙනත් අයවළුන්ට එරෙහිව චෝදනා ගොනු නොකර තිබීම සළකා බලන විට

පෙනී යන්නේ මේජර් ජනරාල් හෙන්දාවිතාරණ පවසන එම කරුණ හුදු ප්‍රකාශයක් පමණක් බවයි.

මේ අනුව පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දුන් මේජර් ජනරාල් කපිල හෙන්දාවිතාරණ සහ මේජර් සලේ යන අයවළුන්ගේ සාක්ෂි වලින් පැහැදිලිව පෙනී ගියේ ඔවුන්ගේ ඒකායන අරමුණ මිලේනියම් සිටි නිවාස සංකීර්ණයේ සිටි යුධ හමුදා බුද්ධි අංශයේ නිලධාරීන් බේරා ගැනීම හැර චූදිත විසින් කරනු ලබන විමර්ශන කටයුත්තට යම් හෝ සහායක් ලබා දීම නොවන බවයි.

ශ්‍රී ලංකාවේ පැවති යුධමය කාලසීමාව තුළ ශ්‍රී ලංකා යුධ හමුදාව මෙන්ම සෙසු හමුදා හා පොලීසියද ශ්‍රී ලංකාවේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා තීරණාත්මක මෙහෙවරක් සිදු කල බව අවිවාදිතය. එසේ වූ පමණින් එකී ආයතනවල සාමාජිකයන් රටේ නීතිමය පාලනයෙන් බැහැර නොවේ. ඔවුන් සියළු දෙනාම නීතිය හා සාමය ක්‍රියාත්මක කරන ආයතන වලට සහාය විය යුතුය. මක්නිසාදයත් ඔවුන් නීතියට පිටින් ක්‍රියා කිරීමට බලයක් ඇති අයවළුවන් නොවන හෙයිනි.

මේ අනුව උඩතලවින්න දස පුද්ගල ඝාතන නඩුව සළකා බලන විට චූදිත විසින් මෙම විමර්ශනය සිදු කලේය යන කරුණේදී ඔහු රාජ්‍ය රහස් සතුරන් අතට පත් කිරීමේ අරමුණින් කටයුතු කල බවට තීරණය කලහැකිද යන්න සළකා බැලිය යුතුය. මෙම කරුණද සළකා බැලිය යුතු වන්නේ ඔහු හට

පොලිස්පතිවරයා  නියම කර තිබූ විමර්ශන කටයුත්ත සමග එක්ව සළකා බලමිනි.

මැතිවරණ සමයක යම් මැතිවරණ කටයුත්තකට සහභාගී වූ හෝ යම් අපේක්ෂකයෙකුට සහාය දක්වන ලද පුද්ගලයන් දස දෙනෙකු එකම ස්ථානයක වෙඩි තබා ඝාතනය කිරීම සරළ සිද්ධියක් ලෙස සැළකීමට හැකියාවක් නැත. එසේම මියගිය පුද්ගලයින් සියළු දෙනාම මුස්ලිම් වැසියන් වීම තුළ එය වාර්ගික සහ ආගමික නොසන්සුන්තාවයකට හේතුවිය හැකි බරපතල සිදුවීමකි. එකී විමර්ශනයට අදාලව නඩු පවරා තිබුණේ ශ්‍රී ලංකා ජනරජයේ නීතිපතිවරයා විසින් වන අතර නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි සමස්ථයක් ලෙස සළකා බැලීමේදී නඩු පැවරීවමට ලක්ව තිබුණේ එවකට ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා සහ ඔහුගේ පුතුන් දෙදෙනෙකුද ඇතුළුව යුධ හමුදා නිලධාරීන් පිරිසකි.

එබැවින් එකී විමර්ශනයට අදාලව යුධ හමුදා බුද්ධි අංශ නිලධාරීන් සිටින ලද ස්ථානයක් පරීක්ෂා කිරීම, ඔවුන් භාරයේ තිබූ ගිනිඅවි සහ අවි ආයුධ අත්අඩංගුවට ගැනීම, ඒ පිළිබඳව අධිකරණයට කරුණු වාර්තා කිරීම, රාජ්‍ය රහස් සොයා බැලීම, ප්‍රසිද්ධ කිරීම ලෙස සැළකීමට හැකියාවක් තිබේද?

රාජ්‍ය රහස් පනතේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ රාජ්‍ය ආරක්ෂාවට අහිතකර ක්‍රියාවන් සිදු කිරීම වැලැක්වීම සහ රාජ්‍ය රහස් සතුරන් අතට පත් කිරීම වැලැක්වීම වේ.

මෙම නඩුවේදී චූදිත යම් ආකාරයකට තම බලය ඉක්මවා හෝ වැඩිදුර විමර්ශනය කිරීමකින් තොරව අතුරුගිරිය ආරක්ෂක නිවස්නයේ සිටි පුද්ගලයන් අත්අඩංගුවට ගත්තේ යැයි උපකල්පණය කලද එහිදී චූදිතගේ ඒකායන පරමාර්ථය වී ඇත්තේ උඩතලවින්න දස පුද්ගල ඝාතනයේ සැකකරුවන් සහ යම්කිසි ස්ථානයක තිබූ බරපතල අවි පිළිබඳ විමර්ශනය කිරීම වේ. ඒ හැර රාජ්‍ය රහස් හෝ ආරක්ෂක කටයුතු පිළිබඳව තොරතුරු සතුරු කල්ලියකට හෝ සතුරු කණ්ඩායමකට ලබාදීම නොවන බව ඉදිරිපත්වී ඇති සාක්ෂි සමස්ථයක් ලෙස සළකා බැලීමේදී පෙනී යයි.

මා ඉහතින් විස්තර කර ඇති පරිදි චූදිත මිලේනියම් සිටි නිවස්නයට යන අවස්ථාව වන විට එය යුධ හමුදා ආරක්ෂිත නිවස්නයක් බවට කිසිදු දැනුමක් තිබුණු බවට සාක්ෂි ඉදිරිපත්ව නැත. ඔහු එම ස්ථානයට යන විට එය නිවාස සංකීර්ණයක පැවති එක් නිවසක් පමණක් බව ඉදිරිපත්ව ඇති සාක්ෂි වලින් පෙනී යයි. පැමිණිල්ලේ සාක්ෂි අංක 06 ට අනුව මෙය යුධ හමුදා බුද්ධි අංශයේ ආරක්ෂිත නිවස්නයක් බව දැනගෙන සිට ඇත්තේ පැ.සා. 06, පැ.සා. 08, යුධ හමුදාපතිවරයා සහ එහි රැඳී සිටි නිලධාරීන් පමණි.

චූදිත විසින් 2001.12.05 වන දින පැවති මැතිවරණයට පෙර මෙවැනි බරපතල සිදුවීම් සිදුවිය හැකි බවට තම ඉහළ නිලධාරීන්ට වාර්තා කර තිබීම සළකා බලන විට මෙම තත්ත්වය මැනවින් තහවුරු වේ.

චූදිත දිවුරුම්පිට සාක්ෂි දෙමින් 2001 දෙසැම්බර් මස පැවති පාර්ලිමේන්තු මැතිවරණයට පෙර මහනුවර දිස්ත්‍රික්කය තුළ ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් සිදු විය හැකි බවට ඉහළ නිලධාරීන්ට වාර්තා කලේය යන කරුණද පැමිණිල්ලෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී හබයට ලක් වී නැත.

අනෙක්අතට විත්තියෙන් වි. 12 ලෙස ලකුණු කරන ලද 2002.01.05 දිනැති නියෝජ්‍ය පොලිස්පති මධ්‍යම බටහිර මෙම වැටලීමට අදාලව උපදෙස් ලබාදෙමින් පවසා ඇත්තේ චූදිත විසින් අත්අඩංගුවට ගන්නා ලද නඩු භාණ්ඩ ඡායාරූපගත කර වීඩියෝගත කරන ලෙසයි.

ඒ අනුව එම කටයුත්තද චූදිත සිදු කර ඇත්තේ ඉහළ නිලධාරීන්ගේ උපදෙස් මත වේ.

එසේම චූදිත දිවුරුම්පිට සාක්ෂි දෙමින් මෙම කාලසීමාව තුළ එනම්, මැතිවරණ සමය තුළ එවකට එක්සත් ජාතික පක්ෂ නායකයා වශයෙන් කටයුතු කරන ලද රනිල් වික්‍රමසිංහ මහතා සහ එක්සත් ජාතික පක්ෂයේ රැස්වීම් ඉලක්ක කරගෙන යුධ හමුදා බුද්ධි අංශ නිලධාරීන් විසින් සහ වෙනත් යුධ හමුදාවේ උපදේශකයන්ගේ මෙහෙයවීම මත යම් ක්‍රියාකාරකමක් සිදු වන බවට රූපවාහිනී ප්‍රවෘත්ති විකාශයක් සිදු වූ බවට පවසන ලදී. මේ සම්බන්ධයෙන් පැමිණිල්ලේ සාක්ෂි අංක 06 මේජර් ජනරාල් හෙන්දාවිතාරණ මාර්ගයෙන් පැ. 08 ලෙස ලිපි ගොනුවක් ලකුණු කරන ලදී. එම ලිපි ගොනුව තුළ අතුරුගිරියේ නිවාසය කුලියට

ගැනීමට අදාල ගිවිසුම අන්තර්ගත වේ. එම ගොනුව තුළ එවකට යුද හමුදාපති ලෙෆ්ටිනන්ට් ජෙනරල් එල්.පී බලගල්ල මහතා විසින් 2001.11.10 දිනැතිව එක්සත් ජාතික පක්ෂ සභාපති චරිත රත්වත්ත මහතාට යවන ලද ලිපියක් අන්තර්ගත වේ. එම ලිපිය ලිවීමට පාදක වී ඇත්තේ චූදිත සාක්ෂි දෙමින් පවසන ලද කරුණ වේ. එනම් චූදිත පවසා සිටියේ එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ සහ පක්ෂ රැස්වීම් ඉලක්ක කරගෙන ප්‍රහාරයක් සූදානම් කර ඇති බවට රූපවාහිනී ප්‍රවෘත්ති විකාශයක වාර්තා වූ බවයි. මෙම කරුණෙහි අන්තර්ගතය සම්බන්ධයෙන් චූදිතගේ සාක්ෂිය ප්‍රවාදක සාක්ෂියක් වුවද, එවැනි කරුණක් ප්‍රකාශය වූ බව හා එය චූදිතට ඇසුනේය යන කරුණ ප්‍රවාදක සාක්ෂියක් නොවේ. චූදිතට එවැනි ප්‍රවෘත්ති විකාශයක් ඇසුනේය යන කරුණ යුධ හමුදාපති බලගල්ලේ විසින් එක්සත් ජාතික පක්ෂ සභාපති චරිත රත්වත්තේ මහතාට යවන ලද ලිපියෙන් තහවුරු වේ. එනම් එම ලිපියෙහි අන්තර්ගතය නොව එවැනි ප්‍රවෘත්තියක් විකාශය වූ බවට චූදිත පවසන කරුණ එම ලිපියෙන් තහවුරු වේ.  කෙසේවෙතත් යුධ හමුදාපතිවරයා විසින් එම ලිපියෙන් කරන ලද චෝදනාව ප්‍රතික්ෂේප කර ඇත.

එවන් තත්ත්වයක් තුළ චූදිත විසින් අතුරුගිරිය නිවස්නය තුළ වූ ගිනිඅවි, බෝම්බ සහ LTTE ඇඳුම් සළකා බලන විට එය වැඩිදුර විමර්ශනයට ලක් කිරීමට සුදුසු බවට ගෙන ඇති තීරණය නීත්‍යානුකූල නොවන බවට නිගමනය කිරීමට හැකියාවක් නැත.

එසේම මිලේනියම් සිටි නිවස්නයේ සිට අත්අඩංගුවට ගත් යුධ හමුදා නිලධාරීන් ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ රඳවාගෙන ප්‍රශ්න කිරීමට දින 90 ක රැඳවුම් නියෝග නිකුත් නොකර තිබුණද, ඔවුන් සමග එම නිවස්නයේ සිටි සුභාෂ්කරන් නමැති අය රඳවාගෙන ප්‍රශ්න කිරීමට අවසර දී ඇත. මෙයද ගැටළුකාරී තත්ත්වයකි. පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දුන් සාක්ෂි අංක 02, 06 සහ 08 අනුව එම නිවාසයේ සිට අත්අඩංගුවට ගත් සියළුම දෙනා යුධ හමුදා බුද්ධි නිලධාරීන් සහ තොරතුරුකරුවන් වේ. ඒ අතරින් යුධ හමුදා නිලධාරීන්ට රැඳවුම් නියෝග නිකුත් නොකිරීමටත්, පැ.සා. 06 සහ 08 පවසන ආකාරයට යුධ හමුදා බුද්ධි නිලධාරීන් දැනුවත්ව ඔවුන් සමග සිටි සිවිල් පුද්ගලයෙකු වන සුභාෂ්කරන්ට ත්‍රස්තවාදය වැලැක්වීම පනත යටතේ රැඳවුම් නියෝග නිකුත් කිරීමද සළකා බලන විට ඔවුන් චූදිතගේ භාරයට ගැනීම සම්බන්ධයෙන් චූදිතගේ සද්භාවය තහවුරු කරන කරුණකි.

එසේම මෙම ස්ථානයේ තිබී අත්අඩංගුවට ගත් ගිනිඅවි සහ බෝම්බ අතරින් නිශ්ක්‍රීය කළයුතු අවි ආයුධ විශේෂ කාර්ය බලකායේ සහකාර පොලස් අධිකාරී එඩාමා විසින් සිදු කර ඇත. එසේම කුරුඳුවත්ත පොලීසියට පැමිණි විශේෂ කාර්ය බලකායේ නියෝජ්‍ය පොලිස්පති නිමල් ගුණතිලක විසින් මෙම ගිනිඅවි සහ බෝම්බ ප්‍රවාහනය කිරීම සඳහා විශේෂ කාර්ය බලකායේ වාහන ලබාදී ඇත.

චූදිත ඒ වන විට පොලිස් අධිකාරීවරයෙකි. මෙම ගිනිඅවි සහ ආයුධ මහනුවරට ප්‍රවාහනය කිරීම සඳහා වාහන ලබා ගැනීමට විශේෂ කාර්ය බලකායට

නියෝග නිකුත් කිරීමට වූදිතට හැකියාවක් නැත. එය ලබාගත යුතු වන්නේ විශේෂ කාර්ය බලකායේ ඉහළ නිලධාරීන්ගේ අනුමැතිය මත වේ. විශේෂ කාර්ය බලකාය ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමෙන්ද පෙනී යන්නේ මෙම කර්තව්‍ය නීත්‍යානුකූලව සිදුවී ඇති බවයි.

එසේම පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද කිසිදු සාක්ෂියකින් අතුරුගිරියේදී හෝ නාරාහේන්පිට යුධ හමුදා පොලිස් මූලස්ථානයේදී හෝ කුරුඳුවත්ත පොලිස් ස්ථානයේදී නඩු භාණ්ඩ ඡායාරූපගත කිරීම සඳහා හෝ මාධ්‍යාවරන ලබාදීම සඳහා වූදිත විසින් මාධ්‍යකරුවන් කැඳවූ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත්ව නැත.

පැමිණිල්ලෙන් පැ. 11 ලෙස ලකුණු කරන ලද ලේඛනයෙහි අතුරුගිරිය ආරක්ෂිත නිවස්නය වැටලීම හේතුකොටගෙන ඝාතනයට ලක් වූ හෝ ප්‍රහාරයට ලක් වූ බුද්ධි අංශ ක්‍රියාකාරකයින් තොරතුරුකරුවන්ගේ ලැයිස්තුවක් ඉදිරිපත් කර ඇත. මෙම නඩුවේදී පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දුන් පැමිණිල්ලේ සාක්ෂි අංක 02 හෝ වෙනත් කිසිදු සාක්ෂිකරුවෙකුගෙන් මෙම වැටලීම හේතුවෙන් අත්අඩංගුවට ගත් යුධ හමුදා බුද්ධි නිලධාරීන් පස්දෙනා සහ සිවිල් පුද්ගලයා හැර එම ස්ථානයේ වෙනත් පුද්ගලයන් සිටි බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත්ව නැත. අඩුම තරමින් එම ස්ථානයේ රැඳී සිටියේ යැයි කියනු ලබන වෙනත් බුද්ධි අංශ නිලධාරීන්ගේ, තොරතුරුකරුවන්ගේ හෝ එවැනි වෙනත් කිසිදු අයෙකුගේ නාම ලේඛනයක් එම ස්ථානයේ තිබී වූදිතගේ භාරයට පත් වූ බවට සාක්ෂි ඉදිරිපත්ව නැත. එබැවින් පැ. 11 දරණ ලේඛනයේ සඳහන් පුද්ගලයන්ට සිදුවූ ජීවිත හෝ

ශාරීරික හානි චූදිත විසින් කරන ලද මෙම වැටලීම හේතුවෙන්ම සිදු වූ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත්ව නැත.

මේ අනුව අතුරුගිරිය මිලේනියම් සිටි හි ආරක්ෂක නිවස්නය පරීක්ෂා කර යුධ හමුදා නිලධාරීන් සහ සුභාෂ්කරන් නමැති පුද්ගලයා තම භාරයට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීම දක්වා වූ කාර්ය පටිපාටිය තුළ චූදිත රාජ්‍ය රහස් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව වරදවල් කරන ලද බවට සාක්ෂි ඉදිරිපත්ව නොමැති බවට මම තීරණය කරමි.

ඒ අනුව ඉදිරිපත් කර ඇති 01, 02, 03 සහ 04 චෝදනා පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කර නොමැති බවට මම තීරණය කරමි. එම නිසා එකී චෝදනා වලින් චූදිත නිදොස් කිරීමට මම තීරණය කරමි.

මීළඟට සළකා බැලිය යුතු වන්නේ චූදිත ඉහත කී පුද්ගලයන් නීති විරෝධී ලෙස රඳවා තැබීමට ආධාර හා අනුබල දී ඇත්ද යන්නයි.

කපිතාන් නිලාම් ඇතුළු හය දෙනෙකු මුල් අවස්ථාවේදී මහනුවර පොලිස් ස්ථානයේද, ඉන් පසුව කටුගස්තොට පොලිස් ස්ථානයේද රඳවා ඇත්තේ මහනුවර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අශෝක රත්නවීර විසින් ලබා දී ඇති රඳවා ගැනීමේ නියෝග මත වේ. මෙම රඳවා ගැනීමේ නියෝගය චූදිත විසින් කරුණු වසන් කර ඉදිරිපත් කරන ලද තොරතුරු මත නිකුත් කර ඇති රඳවා ගැනීමේ නියෝගයක් බවට හෝ එකී රඳවා ගැනීමේ නියෝගය කූඨ ලේඛනයක් බවට

හෝ සාක්ෂි ඉදිරිපත්ව නැත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා එම රඳවා ගැනීමේ නියෝගය නිකුත් කර ඇත.

විත්තිය විසින් ඉදිරිපත් කරන ලද වි. 12 ලේඛනය අනුව එවකට මධ්‍යම පළාත භාරව සිටි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහින්ද බාලසූරිය වාර්තා කර ඇත්තේ මෙය චූදිත විසින් කරනු ලබන විශිෂ්ඨ සණයේ වැටලීමක් බවයි. ඒ අනුව චූදිතට අවශ්‍ය සහාය ලබාදෙන ලෙසද නියෝජ්‍ය පොලිස්පතිවරයා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවයාට දැනුම් දී ඇත.

කෙසේවෙතත් මෙම නඩුවේ සාක්ෂි දුන් විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කොටකදෙණිය, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ධර්මරත්න මාර්ගයෙන් පවත්වන ලද මූලික පරීක්ෂණය හුදෙක් බ්‍රිගේඩියර් හෙන්දාවිතාරණ සහ රැඳවුම් නියෝගයට ලක් වූ කපිතාන් නිලාම් ඇතුළු යුධ හමුදා නිලධාරීන්ගේ ප්‍රකාශ මත පමණක් නිගමනය කර ඇත.

එහිදී එම අවි ආයුධ නීත්‍යානුකූලව නිකුත් කර ඇති ආයුධ බවට කිසිදු විවාදයක් නැත. කෙසේවෙතත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කොටකදෙණිය අධිකරණයේ ඉදිරිපත් කරන ලද සාක්ෂියෙන් යුද හමුදා නිලධාරීන් රැක ගැනීමේ චේතනාවෙන් පමණක් කටයුතු කර ඇති බව පෙනී යයි.

2001 වසරේදී පැවති රජය LTTE සංවිධානය සමග සාකච්ඡා කිරීම එකී රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් වන අතර එකී ප්‍රතිපත්තියට පටහැනිව රාජ්‍ය

නිලධරයෙකුට එය විවේචනය කිරීම හෝ ඊට විරුද්ධව කටයුතු කිරීම සුදුසු නොවේ. එහිදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කොටකදෙණිය ලබාදෙන ලද සාක්ෂිය හුදෙක් තම පුද්ගලික ප්‍රතිපත්තිය මත පිහිටා චූදිතට එරෙහිව ලබා දෙන ලද සාක්ෂියක් විණා චූදිත මෙහිදී අපරාධමය වරදක් සිදු කර තිබේද නැද්ද යන්න සම්බන්ධයෙන් දෙන ලද ස්වාධීන සාක්ෂියක් ලෙස සැළකීමට හැකියාවක් නැත.

මා ඉහතින් සඳහන් කරන ලද පරිදි යුධ හමුදා නිලධාරීන් පස්දෙනා සහ සුභාෂ්කරන් නමැති අය මහනුවර පොලීසියේ සහ කටුගස්තොට පොලීසියේ රඳවා ඇත්තේ ත්‍රස්තවාදය වැලැක්වීම පනත යටතේ නිකුත් කර ඇති වලංගු රැඳවුම් නියෝග මත වේ. එබැවින් චූදිත අයුතු ලෙස සිර කර තැබීමකට ආධාර හා අනුබල දුන් බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවේ.

අනෙක් අතට එම චෝදනාවල සඳහන් කර ඇත්තේ මහනුවර මූලස්ථාන පොලිස් පරක්ෂක එඩ්මන් මහේන්ද්‍ර සහ කටුගස්තොට පොලීසියේ ස්ථානාධිපති ජයම්පති මොහොට්ටිගෙදර එම කාලසීමාව තුළ එම පුද්ගලයන් රඳවා සිටියේ නම් ඔවුන් අයුතු ලෙස සිර කර තැබීමේ වරද සිදු කරන ලද බැවින් චූදිත ඊට ආධාර හා අනුබල දුන් බවයි.

මෙකී චෝදනා වලට අනුව අයුතු සිර කර තැබීමේ වරද සිදු කරනු ලබන්නේ මහනුවර මූලස්ථාන පොලිස් පරීක්ෂක එඩ්මන් මහේන්ද්‍ර සහ කටුගස්තොට පොලීසියේ ස්ථානාධිපති ජයම්පති මොහොට්ටිගෙදර යන අයවළුන් වේ.

කෙසේ නමුත් එම නිලධාරීන් දෙදෙනා එකී පුද්ගලයන් එම පොලිස් ස්ථානවල රඳවා තබන ලද්දේ චූදිතගේ පෙළඹවීම මත හෝ බලකිරීම මත යන කරුණ සනාථ කිරීම සඳහා ඔවුන් සාක්ෂියට හෝ කැඳවා නැත. නමුත් ඔවුන් පැමිණිල්ලේ සාක්ෂිකරුවන් ලෙස අධිචෝදනා පත්‍රයේ නම් කර ඇත. (පැමිණිල්ලේ සාක්ෂි අංක 35 සහ 36)

මෙම සියළුම කරුණු සළකා බැලීමේදී ඉහත කී පුද්ගලයින් මහනුවර සහ කටුගස්තොට පොලීසියේ රඳවා තබා ඇත්තේ මහනුවර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා විසින් නිකුත් කර ඇති වලංගු රඳවා තබා ගැනීමේ නියෝග මත වේ.

එබැවින් ඉදිරිපත් වී ඇති සාක්ෂි සමස්ථයක් ලෙස ළකා බැලීමේදී චූදිත අයුතු සිර කර තැබීමේ වරදට ආධාර හා අනුබල දී ඇති බවට පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කර නොමැති බවට මම තීරණය කරමි. ඉහත හේතූන් අනුව ඉදිරිපත් කර ඇති 05 සිට 14 දක්වා චෝදනා වලින් චූදිත නිදොස් කිරීමට මම තීරණය කරමි.

මීළඟට ඉහත කී චූදිතයින්ට අමතරව මේජර් ජනරාල් හෙන්දාවිතාරණට සහ එවකට යුධ හමුදාපතිව සිටි මේජර් ජනරාල් බලගල්ලේට දණ්ඩ නීති සංග්‍රහයේ 278, 279 වන වගන්ති යටතේ අසත්‍ය ලෙස නඩු පැවරීම යන කරුණ සළකා බලමි. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136(1) ආ වගන්තිය යටතේ මීට

අදාල නඩු පැවරීම සිදු කර ඇත්තේ මහනුවර ස්ථානාධිපති අපරාධ හා මෙහෙයුම් වේ. එනම් උප පොලිස් පරීක්ෂක ධර්මරත්න වේ. අපරාධ නඩු වධාන සංග්‍රහය පනතේ 136(1) ආ වගන්තිය යටතේ විමර්ශන අවසන් කර පැමිණිල්ලක් ගොනු කළ පසු චෝදනා ඉදිරිපත් කිරීමේ වගකීම ඇත්තේ මහේස්ත්‍රාත්වරයාට වේ.

මෙහිදී නඩු පැවරීම චූදිත විසින් සිදු කර නැත. එය සිදු කර ඇත්තේ අපරාධ සහ මෙහෙයුම් ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ධර්මරත්න වේ. උප පොලිස් පරීක්ෂක ධර්මරත්නට නඩු පැවරීම සඳහා අඩුම තරමින් චූදිත බලපෑම් කල බවට හෝ මෙම නඩුවේ සාක්ෂි ඉදිරිපත් වී නැත. පොලිස් පරීක්ෂක ධර්මරත්න පැ.සා. 41 ලෙස සාක්ෂි ලැයිස්තුවේ සඳහන් කර තිබුණද ඔහු සාක්ෂියට කැඳවා නැත.

එබැවින් ඉදිරිපත් කර ඇති 15 සිට 22 දක්වා චෝදනා පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කර නොමැති බවට මම තීරණය කරමි. ඒ අනුව එකී චෝදනා වලින් චූදිත නිදොස් කිරීමට මම තීරණය කරමි.

ඉහත සඳහන් සියළුම හේතූන් අනුව ඉදිරිපත් කර ඇති සියළුම චෝදනා වලින් චූදිත නිදොස් කිරීමට මම තීරණය කරමි.

**(ඒ.කේ.එම්.පටබැඳිගේ)**
**මහාධිකරණ විනිසුරු**
**මහාධිකරණය අංක - 01**
**කොළඹ.**
**2025.03.27**